# නර්තනය

## 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# නර්තනය

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක කෙරේ.)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

**වෙබ් අඩවිය : www.nie.lk**
**විද්‍යුත් තැපෑල : info@nie.lk**

6 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය 2015
© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : ....................................

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යාවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | - | බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ - කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **ලේඛක මණ්ඩලය** | | |
| අභ්‍යන්තර | - | එස්. වර්ණසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, |
| | - | බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ මහත්මිය - කථිකාචාර්ය, |
| | - | බී. එම්. එස්. ද සොයිසා මහත්මිය - කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| බාහිර | - | ගුණසේන රාජපක්ෂ මහතා - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික), |
| | - | කේ. සිරිල් මීගම මහතා-ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික),<br>ගුරු අභ්‍යාස විදුහල, ගිරාගම. |
| | - | ජයන්තා හෙට්ටියවත්ත<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම. |
| | - | කේ. සුසන්ත ගුණවර්ධන මහතා,<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව. |
| | - | ඩී. පී. වයි නිමල් කුමාර මහතා - කථිකාචාර්ය,<br>ගුරු විදුහල, මහරගම. |
| | - | බී. සුජිත් මහතා - ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හම්බන්තොට. |
| | - | එම්. හේවාවිතාරණ මහත්මිය - ගුරු සේවය,<br>බප/ජය/විද්‍යාකර බාලිකා විදුහල, මහරගම. |
| | - | එම්. එම්. එස්. පී. කේ. මාරසිංහ මහත්මිය - ගුරු සේවය,<br>බප/හෝ/ රාජසිංහ මහ විද්‍යාලය, හංවැල්ල. |
| | - | ඒ. ඩබ්. බියංකා එම්. අබේසිංහ මහත්මිය - ගුරු සේවය,<br>බප/ජය/ධර්මපාල විදුහල, පන්නිපිටිය. |
| | - | එම් එම් සමන්ත විජේසිරි මහතා - ගුරු සේවය,<br>දප/මාර/දික්වැල්ල උතුර මහ විදුහල, මාතර. |
| | - | එච්. එල්. සමන්කුමාර මහතා - ගුරුසේවය,<br>දප/ගා/ශ්‍රී දේවානන්ද මහ විදුහල,<br>පනියන, අම්බලන්ගොඩ. |
| **විෂය සංස්කාරක මණ්ඩලය** | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා<br>මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා<br>මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක මහත්මිය<br>ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07. |

| | | |
|---|---|---|
| **භාෂා සංස්කරණය** | - | ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,<br>කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.<br>එස්.ඕ. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථක ව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන, පාසල් නර්තන අධ්‍යාපනය මගින් එකී නිපුණතා සංවර්ධනයට මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත. නර්තන විෂය භාර ව කටයුතු කරන ගුරු භවතුන් මෙම අත්පොත පරිශීලනයේ දීත් පංති කාමර ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දීත් ලබන ස්වකීය අත්දැකීම් ද සැලකිල්ලට ගත යුතු වේ.

06 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය නිපුණතා 07 කින් සමන්විත ය. ඊට අදාළ නිපුණතා මට්ටම් 27 ක් යටතේ ක්‍රියාකාරකම් 32 ක් පෙළ ගස්වා ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමින් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සාමර්ථය ලබාගත්ත ද යහපත් ජීවිතයක් ගත කිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස, හදවත හා දෑත් ද පෝෂණය කළ යුතු වේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය ද යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

උක්ත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරකම් සරල ව පෙළගස්වා ඇති අතර විෂය අන්තර්ගතය දක්වා ඇත්තේ සංක්ෂිප්ත වශයෙනි. ක්‍රියාකාරකම් සැලසුම සඳහා දී ඇති උපදෙස්වල පියවර 01 සඳහා ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාදීමට වඩාත් සුදුසු කාර්යක්ෂම හා නිර්මාණශීලී ඉගෙනුම් ප්‍රවේශ භාවිත කළ හැකි ය. නර්තන විෂය ඉගෙනුම් ක්‍රමශිල්ප විවිධ ය. එමෙන් ම සුවිශේෂ ය. ක්‍රියාකාරකම හා ශිෂ්‍ය ශක්‍යතා හඳුනාගනිමින් අපේක්ෂිත ඉගෙනුම් ඵල කරා ළඟා වීමට හැකි වඩාත් ඵලදායී ඉගෙනුම් ක්‍රම තෝරා ගැනීමට අවකාශ ඇත.

ප්‍රායෝගික කුසලතා සංවර්ධනයේ දී වඩාත් සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට ගුරුවරයා මැදිහත්කරුවකු විය යුතු ය. කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී මනා ආකල්ප මෙන් ම සමූහයක් වශයෙන් ජීවත් වීමේ දී අනුගමනය කළ යුතු ජීවන පුරුදු පිළිබඳ අත්දැකීම් ලබා ගත හැකි ආකාරයට ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු වේ. පංතියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් කළ යුතු ය. ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයන් සපයා ගෙන ආ යුතු රංග උපකරණ හා ද්‍රව්‍ය ඇත්නම් ඒ බව කලින් දැනුම් දීම අත්‍යවශ්‍ය වේ. ගුරු මාර්ගෝපදේශයෙහි එක් එක් නිපුණතා මට්ටම්වල ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති කාලය වඩාත් ඵලදායී ලෙස භාවිත කළ හැකි අතර, අධ්‍යාපන විද්‍යාත්මක පදනමින් දක්වා ඇති වාර සටහන් ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත ඇගැයීම් ක්‍රියාවලිය තුළ සංගත බව ආරක්ෂා වේ.

පාඩම සංවර්ධනයට අදාළ කර ගත හැකි ඉගෙනුම්/ඉගැන්වීම් උපකරණ ගුණාත්මක යෙදවුම් ලෙස ඉදිරිපත් කර ඇති අතර වෙනත් සුදුසු භෞතික හා මානව සම්පත් සැලසුම් සහගත ව භාවිත කිරීම අපේක්ෂා කෙරේ. සෑම ක්‍රියාකාරකමක් ම විනෝදය, කුතුහලය, අළුත් අත්දැකීම් හා ප්‍රායෝගික වීම වැදගත් වේ. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පින්තූර, වගු, දෘශ්‍ය හා ශ්‍රව්‍යපට, ප්‍රශ්නාවලි හා පැවරුම් සූදානම් කර ගත යුතු වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පංතියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාවට ගෙන ඒමට ගුරුවරයා සම්පත් දායකයකු වේ. අපේක්ෂිත ඉගෙනුම් පල සාක්ෂාත්කරණය හා සිසුන්ගේ ප්‍රවීණතා මට්ටම් පිළිබඳ ව ගුරු සිසු දෙපක්ෂය ම දැනුවත් විය යුතු ය. ඇගයීම හා තක්සේරුකරණ උපදෙස් යටතේ ඉගෙනුම් පල ඉලක්ක කොට ගනිමින් සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී හෝ සුදුසු අවස්ථාවල දී ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය ප්‍රශ්න සඳහන් කර ඇත. ඒ සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කරගැනීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සුවිශේෂ අංගයකි. ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය නිම කර සිසුන්ගේ දැනුම තහවුරු කිරීම සඳහා ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ කටයුතු සැලසුම් කිරීමේ උක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් නූතන ගුරු භූමිකාව, පරිණාමන ගුරු භූමිකාව (Transformation Role) ලෙස නම් කර තිබේ.

නිර්මාණශීලී ගුරුවරයකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කරගැනීම සඳහා සරල මග පෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීමේ කාර්යය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවා යි පතමු.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 – 52 |
| විවිධ සහාය | 53 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනාගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කරගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමග ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කරගැනීමට හැකි වන පරිදි විෂය කරුණු මෙහි දී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සැම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චිත්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් අධිෂ්ඨානයෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා, පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**1. සන්නිවේදන නිපුණතා :**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව :** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

**2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

**3. පරිසරයට අදාළ නිපුණතා :**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය :** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය :** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

## නර්තන විෂයයේ අරමුණු

- පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලා කෘති බිහි කිරීම මෙන් ම ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳා ගැනීම සඳහා අවශ්‍ය චින්තනය හා නිර්මාණ කුසලතා ප්‍රවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි ක්‍රියාකාරකම් මගින් අනාගත වැඩ ලෝකයට මුහුණ දිය හැකි ක්‍රියාකාරිත්වය මෙන් ම සමාජයෙහි උසස් ජීවන තත්ත්වයක් ගොඩ නගාගැනීම සඳහා අවශ්‍ය සාමාජීය හා පෞද්ගලික ශක්‍යතා වර්ධනය කිරීම.

- සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන වැඩසටහන් අතරින් හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය විචාර ශක්ති වර්ධනය, රසඥතා වර්ධනය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ලබා දීම.

- දේශීය, විදේශීය නර්තන හා සබැඳි සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය මගින් විවිධ සංස්කෘති අගය කිරීම මෙන් ම ජාත්‍යන්තර සමාජයේ දී දේශීය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය උදාර හැඟීම්, ආකල්ප සංවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි සංස්කෘතික පසුබිම හා සෙසු සංස්කෘති සතු හරයන් හඳුනාගනිමින් පුද්ගල අභිමානයට ගරු කරන මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය සඳහා නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව සංවර්ධනය කිරීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 පරිසරයේ ස්වාභාවිකත්වය අගයමින් විවිධ නිර්මාණ ඉදිරිපත් කරයි. | • පරිසර රසාස්වාදය (ගස්වැල්, දියඇලි, මුහුද, ගංගා)<br>• ශබ්ද, නාද, චලන, හැඩතල, වර්ණ, රටා, පිළිබඳ අවබෝධය<br>• චිත්‍ර, කවි, ගීත හා චලන නිර්මාණ | • පරිසරයේ සුවිශේෂතා හඳුනාගනිමින් විවිධ නිර්මාණ ඉදිරිපත් කරයි. | 04 |
| | 1.2 පරිසරයෙන් ලබන අත්දැකීම් ඇසුරින් චලන නිර්මාණ කරයි. | • චලන නිර්මාණය<br>පිම්බීම හැකිලීම (බැලුනය, මල්)<br>දිගහැරීම (පැදුර)<br>පෙරළීම (රෝදය, බෝලය) | • පරිසරයේ ස්වභාවික හා නිර්මිත වස්තූන්හි සුවිශේෂතා අධ්‍යයනය කර ඒවා ඇසුරින් චලන ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | 02 |
| | | • පැනීම, කැරකීම, රිංගීම ඇවිදීම ආශ්‍රිත චලනවල ස්වභාවය (මිනිස් හා සත්ත්ව චරිත ආශ්‍රිත ව) සමබරතාව | | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණ කරයි. | • භාව ප්‍රකාශනය- සතුට (සිද්ධියක් ඇසුරෙන්) | • පරිසරයේ අසිරිය භාව ප්‍රකාශනය සහිත ව නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරමින් ඒවා අගය කරයි. | 02 |
| | 1.4 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා - ගනිමින් නර්තන නිර්මාණ කරයි. | • කළගෙඩි නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණය<br>• ලීකෙළි නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා- ගනිමින් නර්තන නිර්මාණය | • දේශීය ගැමි නැටුම්වල අන්තර්ගත සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් සමූහයක් ලෙස නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 04<br>04 |
| 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 ශාරීරික නම්‍යතාව සඳහා නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි. | • නම්‍යතා අභ්‍යාස කිරීමේ වැදගත්කම<br>• නම්‍යතා අභ්‍යාස හතරක් | • ශාරීරික සමබරතාව හා සාම්ප්‍රදායික නර්තන අංගයන්හි නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය සඳහා නම්‍යතා අභ්‍යාස ප්‍රදර්ශනය කරයි | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 පාද චලන හුරු කරගැනීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි. | • නමස්කාරය<br>• මණ්ඩිය<br>• පා සරඹ/ මණ්ඩි පද 1-3 දක්වා හමාර පදය සමගින් | • සාම්ප්‍රදායික නර්තන හා සබැඳි නමස්කාර ගායන භාවිතයට ගනිමින් මූලික ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරයි. | 04 |
| | 2.3 සරඹ අභ්‍යාසයෙන් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි. | • ගොඩ සරඹ/ඉලංගම් සරඹ/ දොඹින පද 1-2 දක්වා කස්තිරම/ ඉරට්ටිය/හමාර පදය සමගින් විලම්භ, මධ්‍ය ලයට | • සාම්ප්‍රදායික නර්තන හුරු වීමට අවශ්‍ය මූලික සරඹ පද පිළිබඳ පසුබිම හඳුනාගනිමින් සරඹ /පද ඉදිරිපත් කරයි. | 04 |
| | 2.4 නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය විස්තර කරයි. | • ශරීරාවබෝධය ශරීරයේ අංග, ප්‍රත්‍යාංග සහ උපාංග භාවිත වන අයුරු | • නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය හඳුනා-ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි. | 02 |
| | 2.5 සාම්ප්‍රදායික චලන භාවිත කරමින් අලංකාර පද (මාත්‍රා) නිර්මාණ කරයි. | • උඩරට/පහතරට /සබරගමු අලංකාර පද (මාත්‍රා) 02ක් (සුළු (මාත්‍රා 2) තනි තිතට) | • සාම්ප්‍රදායික නර්තන හා සබැඳි චලන භාවිත කරමින් නියමිත අංගහාර සහිත ව නර්තන අංග නිර්මාණ කර ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.6 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • උඩරට-හනුමා වන්නම/ පහතරට-හනුමන්තා තාලය සින්දු වන්නම/සබරගමු-අනිලා වන්නම/කස්තිරම/ ඉරට්ටිය/ කලාසම සමග | • වන්නම් ඉදිරිපත් කිරීමෙන් නර්තන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 04 |
| | 2.7 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | • ප්‍රස්තාරකරණයේ විධික්‍රම තාලය ,මාත්‍රා, ආඝාතය, විභාග, සංඥා සලකුණු<br><br>• තනි තිතේ ප්‍රභේද (සුළු, මැදුම්, මහ) (මාත්‍රා 2, 3, 4)<br><br>• සුළු (මාත්‍රා 2) තනි තිතට රබන් පද, බෙර පද, ලී කෙළි කවි, වන්නම් ප්‍රස්තාර | • මූලධර්ම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගැනීම | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ නිරීක්ෂණය කර ඒ පිළිබඳ අදහස් දක්වයි. | 02 |
| | 3.2 විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි. | • විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය | • විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි. | 03 |
| | 3.3 විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් ශබ්ද හා නාද නිපදවයි. | • ශබ්ද හා නාද නිපදවීම තනි තිත් රූප අනුව | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් නාද හා ශබ්ද නිර්මාණ ඉදිරිපත් කරයි. | 02 |
| | 3.4 තේමාවට අනුව සමූහ වාදන ප්‍රදර්ශනය කරයි. | • සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් තේමාවට අනුව සමූහ වාදනය (කෝච්චිය) | • සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් තේමාවකට අනුව වාදන නිර්මාණ ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 නියමිත ගායනවල සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • ලී කෙළි, කළගෙඩි, නැළවිලි හා වන්නම් ගායනවල සංස්කෘතික පසුබිම | • අදාළ ජන ගායනයන්හි සංස්කෘතික හා සාමාජීය පසුබිම හඳුනාගනිමින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 4.2 නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි. | • ලී කෙළි, කළගෙඩි කවි, නැළවිලි කවි, හනුමා වන්නම/හනුමන්තා තාලය/ අනිලා වන්නම ගායනය | • නිවැරදි නාද, හඳුනාගනිමින් ජන ගායන ඉදිරිපත් කරයි. | 04 |
| 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි සාරධර්ම අගයමින් අදහස් දක්වයි. | • සාරධර්ම ගුරු ගෙදර හා සබැඳි චාරිත්‍ර විධි, ගුරුවන්දන ගායන | • ගුරු ගෙදර හා සබැඳි චාරිත්‍ර විධි, ගුරුවන්දන ගායන පිළිබඳ තම අදහස් ඉදිරිපත් කරයි. | 02 |
| | 5.2 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායවල තොරතුරු ඉදිරිපත් කරයි. | • ශ්‍රී ලාංකේය නර්තන සාම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, වාද්‍ය භාණ්ඩ ,රංග වස්ත්‍රාභරණ (නාමික වශයෙන් හඳුනාගැනීම) | • ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායවල තොරතුරු අධ්‍යයනය කර එහි මූලික කරුණු ඉදිරිපත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • නර්තන ශිල්පී නිත්තවෙල ගුණයා<br>• නර්තන ශිල්පී එන්. ඒ සිරිබෝහාමි<br>• නර්තන ශිල්පී සවුරිස් සිල්වා | • ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායවල ප්‍රවීණ කලා ශිල්පීන් පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමින් ඔවුන්ගෙන් නර්තන කලාවට සිදු වූ සේවය අගය කරයි. | 02 |
| 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 සබරගමුව සමන් දේවාල පෙරහර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් එහි සුවිශේෂ ලක්ෂණ විචාරය කරයි. | • ප්‍රාදේශීය ආගමික උත්සව (සබරගමු සමන් දේවාල පෙරහර) පැවැත්වීමට හේතු පුද පූජා, පවත්වන කාල සීමාව. පෙරහර හා සබැඳි නර්තන, ගායන, වාදන, සැරසිලි, රංග වස්ත්‍රාභරණ | • සබරගමු සමන් දේවාල පෙරහර හා සබැඳි සංස්කෘතික ලක්ෂණ පිළිබඳ ව විචාරය කරයි. | 03 |
| | 6.2 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි. | • සෙම්බු කෝලාට්ටම් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ | • ද්‍රවිඩ සංස්කෘතියට අයත් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් ඒවා ඇගයීමට ලක් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 වෙනත් සංස්කෘති හා සබැඳි නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි. | • සෙම්බු හෝ කෝලාට්ටම් නර්තනය | • සෙම්බු හෝ කෝලාට්ටම් නර්තන ඉදිරිපත් කර ඒ පිළිබඳ අගයමින් අදහස් දක්වයි. | 02 |
| | 6.4 විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | • වෙසක් උත්සවය<br>• තෛයිපොන්ගල් උත්සවය<br>• නත්තල් උත්සවය | • ආගමික හා සමාජයීය උත්සවය හා සබැඳි සංස්කෘතික වටිනාකම් අගයමින් අදහස් දක්වයි. | 06 |
| 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1 නිර්දේශිත ගීතයට සවන් දී එහි සුවිශේෂතා සාකච්ජා කරමින් අදහස් ඉදිරිපත් කරයි. | • පාන්දරින් ඉස්කෝලෙට /මගෙ පොඩියාළු ගීතයේ පද රචනය, සංගීතය, ගායනය , අර්ථය, භාෂාත්මක විග්‍රහය | • ගීත ශ්‍රවණය කර, එහි කලාත්මක ලක්ෂණ, පිළිබඳ අදහස් දක්වයි. | 02 |
| | 7.2 ගීත අනුව නර්තන නිර්මාණය කරයි. | • පාන්දරින් ඉස්කෝලෙට / මගෙ පොඩි යාළු ගීතය | • ගීතයට අනුව නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 03 |
| | 7.3 සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි. | • පරිසරයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය භාවිත කර සැරසිලි අංගයක කොටසක් (තෝඩු කට්ටකොළය ගොප් කොළයෙන්) | • ගොප්කොළ සැරසිලි අංගයක් නිර්මාණය කිරීමේ දී නිසි ශිල්ප ක්‍රම භාවිතයට ගනියි. | 04 |
| | | | | 84 |

## 1- වාරය

| ක්‍රියාකාරකම් අංක | | | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.1.1 | - | නම්‍යතා අභ්‍යාසයේ යෙදෙමු | 02 |
| 1.1.1 | - | පරිසර සුන්දරත්වය අගයමු | 04 |
| 1.2.1 | - | විවිධ චලන නිර්මාණය කරමු | 04 |
| 4.2.1 | - | නැළවිලි කවි ගයා රස විඳිමු | 01 |
| 5.1.1 | - | ගුරු ගෙදර හා බැඳි සාරධර්ම සුරකිමු | 02 |
| 2.2.1 | - | නැටුමට අවසර ගෙන පාද තබමු | 04 |
| 6.4.1 | - | තෛයිපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු | 02 |
| 4.1.1 | - | ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනාගනිමු | 02 |
| 4.1.2 | - | ලී කෙළි හා කළගෙඩි කවි ගයමු | 02 |
| | | | 23 |

## 11- වාරය

| ක්‍රියාකාරකම් අංක | | | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.4.1 | - | කළගෙඩි නැටුම නිර්මාණයට එක් වෙමු | 04 |
| 2.3.1 | - | සාම්ප්‍රදායික නර්තනයට හුරු වෙමු | 04 |
| 1.3.1 | - | චරිත නිරූපණයේ දී සතුට ප්‍රදර්ශනය කරමු | 02 |
| 3.1.1 | - | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමු | 02 |
| 3.2.1 | - | විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරමු | 03 |
| 5.2.1 | - | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හඳුනාගනිමු | 02 |
| 4.2.2 | - | වන්නම් ගායනය ඉදිරිපත් කරමු | 01 |
| 6.4.2 | - | වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු | 02 |
| 7.1.1 | - | ගීත අසමු, රස විඳිමු | 02 |
| 7.2.1 | - | එක් වී ගීතයට නටමු | 03 |
| 6.2.1 | - | සෙම්බු, කෝලාට්ටම් නර්තන අංග හඳුනාගනිමු | 03 |
| 6.3.1 | - | චෙම්බු, කෝලාට්ටම් නර්තන අංගයක් නිර්මාණය කර ඉදිරිපත් කරමු | 03 |
| 2.5.1 | - | බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ | 02 |
| | | | 33 |

## 111- වාරය

| ක්‍රියාකාරකම් අංක | | | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.4.2 | - | ලී කෙළි නැටුමක් නිර්මාණය කරමු | 04 |
| 2.4.1 | - | නර්තනයේ දී සිරුර කෙසේ හසුරුවන්නේදැ යි විමසමු | 02 |
| 2.6.1 | - | වන්නම් ගයමින් නටමු | 04 |
| 2.7.1 | - | ප්‍රස්තාරකරණයේ යෙදෙමු | 03 |
| 3.3.1 | - | වාදනයෙන් ශබ්ද හා නාද නිපදවමු | 02 |
| 3.4.1 | - | ශබ්ද නාද මුසු කරමින් මවමු දුම්රියක් | 02 |
| 5.3.1 | - | නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු | 02 |
| 6.1.1 | - | සමන් දේවාල පෙරහර අසිරිය පවසමු | 03 |
| 7.3.1 | - | ගොප්කලා අංගයක් නිර්මාණය කරමු | 04 |
| 6.4.3 | - | නත්තල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු | 02 |
| | | | 28 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි .

**නිපුණතා මට්ටම 1.1** : පරිසරයේ ස්වාභාවිකත්වය අගයමින් විවිධ නිර්මාණ ඉදිරිපත් කරයි .

**ක්‍රියාකාරකම 1.1.1** : 'පරිසර සුන්දරත්වය අගයමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 1.1.2** :

- පරිසරයේ ඇසෙන විවිධ ශබ්ද හා නාද පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි .
- පරිසරයේ දක්නට ලැබෙන ගස් වැල්, දිය ඇලි, මුහුද, ගංගාවල විවිධ චලන, හැඩතල, වර්ණ හා රටා පිළිබඳ නිරීක්ෂණය කර ඒ පිළිබඳ ව අදහස් දක්වයි .
- පරිසර අසිරිය සිතුවම් කරයි .
- පරිසර නිරීක්ෂණයෙන් ලද අත්දැකීම් ඇසුරු කරගනිමින් චලන නිර්මාණ කරයි .
- පරිසර අසිරිය පිළිබඳ කවි, ගීත රචනා කරයි .
- ස්වාභාවික පරිසරය සුරැකීමේ අවශ්‍යතාව විස්තර කරමින් පරිසරය සුරැකීමට යෝජනා ඉදිරිපත් කරයි .

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය දෘශ්‍යපට / කැසට් යන්ත්‍රය / VCD දර්ශන යන්ත්‍රය / අදාළ පින්තූර / නිරීක්ෂණ පත්‍රිකාව .

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : පියවර 1 හි දක්වා ඇති ක්‍රම හෝ වෙනත් සුදුසු ක්‍රම භාවිත කරන්න.

**පියවර 1**

- පරිසර අසිරිය තේමා කරගත් ගීත ශ්‍රවණය/ගස්වැල්,දියඇලි, ගංගා, මුහුද පසුතල දර්ශන ඇතුළත් දෘශ්‍යපට ප්‍රදර්ශනය/ක්ෂේත්‍ර චාරිකාවලින් පරිසර නිරීක්ෂණය කර අත්දැකීම් ලබා ගැනීමට සලස්වා පරිසරයේ දක්නට ලැබුණු ශබ්ද හා නාද, චලන රටා, හැඩතල හා වර්ණ පිළිබඳ සිසු අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවීම.

.

**පියවර 2**

- පරිසරය පිළිබඳ කවි ගීත සිතුවම් හා චලන නිර්මාණයට යොමු කරවීම .

**පියවර 3**

- සිසු නිර්මාණ ප්‍රදර්ශනයට අවස්ථාව සලසා ඒ පිළිබඳ ඇගයීම හා නිර්මාණ පෝෂණය කරගැනීමට උපදෙස් ලබාදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- පරිසර අසිරිය පිළිබඳ කවි, ගීත හෝ සිතුවම් නිර්මාණය කරන්න .
- පරිසර නිරීක්ෂණයෙන් ලද අත්දැකීම් ඇසුරින් සරල නර්තනයක් නිර්මාණය කර ප්‍රදර්ශනය කරන්න .
- පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් දක්වන්න .

| | | |
|---|---|---|
| **නිපුණතාව 1.0** | : | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. |
| **නිපුණතා මට්ටම 1.2** | : | පරිසරයෙන් ලබන අත්දැකීම් ඇසුරින් චලන නිර්මාණය කරයි. |
| **ක්‍රියාකාරකම 1.2.1** | : | 'අපි විවිධ චලන නිර්මාණය කරමු' |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 04 යි. |

**ඉගෙනුම් පල 1.2.2** :

- මිනිස් හා සත්ත්ව චරිතවල ගමන් විලාස ප්‍රදර්ශනය කරයි.
- චලන ඉදිරිපත් කිරීමේ ස්වභාවය හා සමබරතාව පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- චලන ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ශාරීරික නම්‍යතාව පවත්වා ගත හැකි බව පවසයි.
- සාමූහිකත්වයෙන් යුතු ව චලන නිර්මාණ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- මිනිස් හා සත්ත්ව චරිත, ගමන් විලාස හා චලන පිළිබඳ නිරීක්ෂණයට යොමු කරවන්න.
- චලන ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ ස්වභාවය හා සමබරතාව පවත්වා ගත යුතු ආකාරය පිළිබඳ සිසු අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 1 : පහත සඳහන් ක්‍රියාකාරකම් විධාන අනුව ක්‍රියාත්මක කරවීම

- හැකිලී ඇති බැලූනයකි. එයට මඳින් මඳ හුලං පිරේ. හුලං පිරුණු බැලූනය සතුටින් නටයි. නටන අතර බැලූනයේ හුලං ක්‍රමයෙන් අඩු වී බැලූනය හැකිලී යයි.
- මල් පොහොට්ටු පිබිදෙයි. සුළං හමයි. පිපුණු මල් තාලයට ඒ මේ අත පැද්දෙයි. සතුටින් නටයි. ක්‍රමයෙන් මල හැකිලෙයි.
  - බෝලයක් ඒ මේ අත පෙරළෙයි.
  - හැකිලී ඇති පැදුරක් දිගහැරී නැවතත් හැකිලෙයි.
  - කරත්ත රෝදයක් කැරකෙයි.

පියවර 2 :

- ඉබ්බෙක් ගමනක් යයි. ශබ්දයක් ඇසී ආරක්ෂා වෙමින් ගමන නතර කරයි. නැවත ගමනේ යයි.
- අශ්වයෙක් ඉතා සෙමෙන් ගමන් කරමින් සිට හදිසියේ ම වේගයෙන් දිව යයි. නැවතත් වේගය අඩු කරමින් ගමන් කරයි.
- අලියකු පෙරහැරේ යයි. බෙර නාදයට පාද තබන අලියා සතුටින් නටයි. අසල ඇති ගසක් ළඟ නැවතී කොළ කඩා කයි. නැවත ගමන් කරයි.

**පියවර 3** :
- 'පුහුල් හොරා කරෙන් දැනේ' සිද්ධිය ඇසුරු කරගෙන නර්තන නිර්මාණය කරවීම.
- සිසු ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඒ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ශිෂ්‍ය ශක්‍යතා සැලකිල්ලට ගනිමින් ඇගයීමට ලක් කරන්න.
- පිම්බීමේ සහ හැකිලීමේ චලන නිර්මාණ ඉදිරිපත් කරන්න.
- බරක් ඔසවාගෙන යන ගමන් විලාසයක් ප්‍රදර්ශනය කරන්න.
- ඉබ්බා, අලියා හා අශ්වයාගේ ගමන් විලාසයක් ප්‍රදර්ශනය කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණ කරයි.

**ක්‍රියාකාරකම 1.3.1** : චරිත නිරූපණයේ දී සතුට ප්‍රදර්ශනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 1.3.2** :

- උද්‍යෑසනක පරිසර අසිරිය විස්තර කරයි.
- සිද්ධියට අදාළ චරිතවල ස්වභාව ප්‍රදර්ශනය කරයි.
- සතුට ප්‍රදර්ශනය වන පරිදි චරිත නිරූපණය කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව ක්‍රියාකාරකම්හි යෙදෙයි.
- සාර්ථක නිර්මාණයකට කණ්ඩායමේ සියලුම සාමාජිකයන්ගේ සක්‍රීය දායකත්වය වැදගත් වන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය, දෘශ්‍යපට, පින්තූර, බෙරය, තාලම්පට, විකල්ප උපකරණ, කාර්ය පත්‍රිකා අංක 03.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : සතුටින් ක්‍රියාකාරකම්වල යෙදීමත්, ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී සතුට ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට මග පෙන්වීමත් අත්‍යවශ්‍ය ය.

පියවර 1 :

- ස්වාභාවික පරිසර පිළිබඳ චමත්කාරය දනවන, සතුට ප්‍රදර්ශනය වන කලාත්මක නර්තන අංගයක් ප්‍රදර්ශනය කිරීම.
- සිසුන් නරඹන ලද නර්තන අංගයෙහි චලනවල ස්වභාව, භාව ප්‍රකාශනය, අවකාශ භාවිතය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :

- කාර්ය පත්‍රිකා අංක 03 කණ්ඩායම් 3කට බෙදා දී එහි සඳහන් සිද්ධිය නිර්මාණය කිරීමට මග පෙන්වීම.

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- එක් කණ්ඩායමක් නිර්මාණය ඉදිරිපත් කරන විට සෙසු කණ්ඩායම්වලට ඒ පිළිබඳ නිරීක්ෂණ සටහන් කරගැනීමට උපදෙස් දීම.
- සියලු ම කණ්ඩායම් නිර්මාණ ඉදිරිපත් කිරීමෙන් පසු නිරීක්ෂණ සටහන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී භාව ප්‍රකාශනයෙන් සතුට ඉස්මතු වීම, කණ්ඩායම් හැඟීමෙන් යුතු ව චලන ඉදිරිපත් කිරීම, සහයෝගය හා සාමූහිකත්වය නිර්මාණයේ සාර්ථකත්වයට බලපාන බව, සතුට ප්‍රදර්ශනය කිරීම සඳහා උපාංග භාවිතයේ වැදගත්කම පිළිබඳ විස්තර කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- පරිසරයේ අසිරිය පිළිබඳ ගීතයක් හෝ කවියක් අනුව නර්තන නිර්මාණ ඉදිරිපත් කරන්න.
- පරිසර සුන්දරත්වය ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණයේ යෙදෙන්න.
- සෙසු නිර්මාණ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකා 03** :

- සුන්දර උදෑසනක ඉර පායයි. සුළං හමයි, මල් නටයි

  **චරිත** - **ඉර, සුළඟ, ගස්, මල්**

  ඉහත සිද්ධිය සතුට ප්‍රකාශ වන පරිදි ඉදිරිපත් කරන්න.

- ගංගාවක්, දිය පාරක් ගලා බසී. ඒ අසල දිය බීමට පැමිණෙන මුව පොව්වෝත් හා පැටවුත් දිය බී ඔබ මොබ සතුටින් දුව පනිති, නටති

  **චරිත** - **ගංගාව, මුව පොව්වන්, හා පැටවුන්**

  ඉහත සිද්ධිය සතුට ප්‍රකාශ වන පරිදි ඉදිරිපත් කරන්න.

- මල්වත්තක පිපුණු මල් සතුටින් නටයි. මී මැස්සෝ, සමනලයෝ, කුරුල්ලෝ මල්රොන් උරා බී සතුටින් නටති.

  **චරිත** - **මල්, මී මැස්සන්, සමනලයන්**

  ඉහත සිද්ධිය සතුට ප්‍රකාශ වන පරිදි ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.4** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.4.1** : 'කළගෙඩි නැටුම නිර්මාණයට එක් වෙමු.'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 1.4.1** :

- කළගෙඩි නැටුමෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- කළගෙඩි නැටුමට උචිත සරල පද (මාත්‍රා) නිර්මාණය කරයි.
- අවකාශ භාවිතය හා රංග රටා මනා ලෙස යොදා ගනියි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව නර්තනයේ යෙදෙයි.
- නර්තන නිර්මාණයේ සාර්ථකත්වය සඳහා සෑම සාමාජිකයකු ම සක්‍රිය ව දායක වෙයි.
- නිමාවකින් යුතු කළගෙඩි නැටුමක් ඉදිරිපත් කරයි.
- තම නිර්මාණ පිළිබඳ ව අන් අය දක්වන අදහස් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : කණ්ඩායම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම ඵලදායී වන අතර උපකරණය හැසිරවීම, අවකාශ භාවිතය හා සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කරන්න.

**පියවර 1** :

- බෙර වාදනයට අනුව කළගෙඩි නැටුමේ කවි ගායනය කර කළගෙඩි නැටුම සරල පද (මාත්‍රා), සරල රංග වස්ත්‍රාභරණ යොදා ගනිමින් සාමූහික ව ඉදිරිපත් කරන විනෝදාස්වාදය අරමුණු කරගත් කාන්තාවන්ට වඩාත් උචිත ගැමි නර්තනයක් බව සිසුන් සමග සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- කණ්ඩායම් වශයෙන් කළගෙඩි නැටුම නිර්මාණයට අවස්ථාව සැලසීම හා මග පෙන්වීම.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායම්වල නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.

**පියවර 4** :

- නිර්මාණ පිළිබඳ සිසු අදහස් විමසමින්, නැටුමට උචිත සරල පද (මාත්‍රා) නිර්මාණය, අවකාශ භාවිතය හා රංග රටා, කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීම, ගායනය, වාදනය හා රංග උපකරණය නිර්මාණාත්මක ව හැසිරවීම, නිමාවක් සහිත කළගෙඩි නැටුමක් ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමට බලපාන ආකාරය පිළිබඳ විස්තර කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : ක්‍රියාකාරකමට අදාළ ඉගෙනුම් පල කිහිපයක් ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී තක්සේරු කළ හැකි ය.

- කළගෙඩි නැටුමෙහි දැකිය හැකි ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- නිමාවකින් යුතු කළගෙඩි නැටුමක් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.4** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.4.2** : 'ලී කෙළි නැටුමක් නිර්මාණය කරමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 1.4.3** :

- ලී කෙළි නැටුමෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- ලී කෙළි නැටුමට උචිත සරල අලංකාර පද නිර්මාණය කරයි.
- අවකාශ භාවිතය හා රංග රටා මනා ලෙස යොදා ගනියි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව නර්තනයේ යෙදෙයි.
- නිමාවකින් යුතු ව ලී කෙළි නැටුමක් ඉදිරිපත් කරයි.
- ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ අදහස් දක්වයි.
- තම නිර්මාණ පිළිබඳ අන් අය දක්වන අදහස් විමසයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම් පට හා බෙර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : රංග උපකරණ භාවිත කරමින් නර්තන නිර්මාණය කිරීම අපේක්ෂිත ය.

පියවර 1 :

- බෙර වාදනයට අනුව ලී කෙළි කවි ගායනය කිරීම. ලී කෙළි නැටුම් නිර්මාණ සුවිශේෂ ජවයක් ඇති ව සාමූහික ව විනෝදාස්වාදය සඳහා කරනු ලබන නර්තනාංගයක් බවත් රංග රචනයේ දී අවකාශ භාවිතය හා සම්බන්ධතා පිළිබඳ සැලකිලිමත් ව ක්‍රියාකාරකමෙහි නිරත විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2 :

- කණ්ඩායම් වශයෙන් ලී කෙළි නැටුම නිර්මාණයට අවස්ථාව සලසා දීම හා අවශ්‍ය මග පෙන්වීම.

පියවර 3 :

- එක් එක් කණ්ඩායම්වල නිර්මාණ ඉදිරිපත් කිරීම.
- නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී වාදනයෙන් සහාය වීම.
- එක් කණ්ඩායමක් ඉදිරිපත් කිරීමේ දී සෙසු කණ්ඩායම් ගායනයට හා නිරීක්ෂණයට යොමු කරමින් සංවර්ධනාත්මක අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 :

- සිසු අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින්, නැටුමට උචිත සරල පද (මාත්‍රා) නිර්මාණය, අවකාශ භාවිතය හා රංග රටා, උපකරණ නිර්මාණාත්මක ව භාවිතය, කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීමේ වැදගත්කම, නර්තනය, ගායනය, වාදනය හා රංග උපකරණ අතර ඇති සුසංයෝගය, නිමාවක් සහිත නැටුමක් ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : සිසුන් නිර්මාණය කරන ලද ලී කෙළි නැටුම තවදුරටත් සංවර්ධනය කර ගැනීමට අවස්ථාව හා උපදෙස් දීමෙන් අනතුරු ව අභ්‍යාස කළ පසු ඇගයීම කරන්න.

- ලී කෙළි නැටුමේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- ප්‍රාසංගික ව ඉදිරිපත් කළ හැකි නිමාවක් සහිත ලී කෙළි නැටුමක් නිර්මාණය කරන්න.
- කණ්ඩායම් වශයෙන් ලී කෙළි නර්තනය ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 2.0** : නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : ශාරීරික නම්‍යතාව සඳහා නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.1.1** : 'නම්‍යතා අභ්‍යාසයේ යෙදෙමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 2.1.2** :

- නම්‍යතා අභ්‍යාස කිරීමේ වැදගත්කම විස්තර කරයි.
- මෙම අභ්‍යාසවල නිරත වීමෙන් කායික හා මානසික ප්‍රබෝධයක් ලැබෙන බව ප්‍රකාශ කරයි.
- සංගීතමය රිද්මයකට / තාලයකට ලැබෙන විධාන අනුව කේවල ව හා සාමූහික ව නම්‍යතා අභ්‍යාසයන්හි යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : ශාරීරික අභ්‍යාස ඡායාරූප, සංගීත ඛණ්ඩ සහිත කැසට් පට / CD, DVD තැටි /කැසට් යන්ත්‍රයක් / CD, DVD යන්ත්‍රයක්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : නර්තනයට අවශ්‍ය ශාරීරික නම්‍යතාව සංවර්ධනය කරගැනීමට සුදුසු අභ්‍යාස කීපයක් තෝරා ගන්න.

**පියවර 1** :

- සංගීත ඛණ්ඩ සහිත කැසට් පට / CD, DVD තැටි හෝ බෙර වාදනය කර සරල නම්‍යතා අභ්‍යාසයක් ප්‍රදර්ශනය කර නම්‍යතා අභ්‍යාස හඳුන්වා දීම.

**පියවර 2** :

- තෝරාගත් නම්‍යතා අභ්‍යාස 04 ක් ප්‍රදර්ශනය කිරීම.
- සංගීත ඛණ්ඩ හෝ බෙර වාදනය කර සිසුන්ට එම අභ්‍යාස කිරීමට අවකාශ සැලැස්වීම. විධාන අනුව වේගය අඩු වැඩි කරමින් නම්‍යතා අභ්‍යාස කිරීම. සිසු චලන හා ඉරියව් නිරීක්ෂණය කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබා දීම.

**පියවර 3** :

- නම්‍යතා අභ්‍යාස කිරීමේ දී අනුගමනය කළ යුතු විධික්‍රම, නිවැරදි ඉරියව්, අංගහාර, හැඩතල චලන හා ශරීරාංග ක්‍රියාත්මක වන ආකාරය සාකච්ඡා කරමින් අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නම්‍යතා අභ්‍යාස කිරීමේ වැදගත්කම පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න.
- නම්‍යතා අභ්‍යාසයේ සුවිශේෂ ලක්ෂණ නම් කරන්න.
- නම්‍යතා අභ්‍යාසයේ නිරත වීමෙන් කායික හා මානසික ප්‍රබෝධයක් ලැබෙන ආකාරය විස්තර කරන්න.
- සංගීතමය රිද්මයකට ලැබෙන විධාන අනුව කේවල ව හා සාමූහික ව නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරන්න.

**පැවරුම** :

- ඔබ උගත් නම්‍යතා අභ්‍යාස ඇසුරින් සාමූහික කෙටි රංගන ක්‍රියාකාරකමක් ගුරු උපදෙස් අනුව නිර්මාණය කරන්න. එය ශිෂ්‍ය කලා කවයේ දී (කලා සංගමයේ දී) ඉදිරිපත් කරන්න.

**නම්‍යතා අභ්‍යාසයේ විශේෂ ලක්ෂණ** :

- සැහැල්ලු බව, සරල බව, නම්‍යශීලී බව, සමබරතාව, කායික හා මානසික ප්‍රබෝධය, හැඩතල, ඉරියව් හා වේගය, අවකාශ භාවිතය.

**නම්‍යතා අභ්‍යාසයෙන් ලැබෙන ප්‍රයෝජන** :

- නර්තනයේ දී ශාරීරික අඟ පසඟ නම්‍යශීලී ව හා අලංකාර ව චලනය කිරීමට හැකිවීම.
- හිස, කඳ, දෑත්, දෙපා යන ශරීර ඉන්ද්‍රියන් සඳහා වෙන වෙන ම හා ඒ එකිනෙක සමෝධානිත වන පරිදි නම්‍යතා අභ්‍යාස නිර්මාණය කරගත හැකි වීම.
- පුද්ගල හා පොදු අවකාශය සමබර ව භාවිතයට ගනිමින් නිදහස් ව චලන ක්‍රියාකාරකම් කළ හැකි වීම.
- අභ්‍යාස කිරීමේ දී මානසික හා කායික ශක්තීන් වර්ධනය වීම.
- තම ශරීර ඉන්ද්‍රියන් සැහැල්ලුවෙන් හැසිරවීමට අවශ්‍ය ප්‍රායෝගික කුසලතා සංවර්ධනය වීම.
- සමබරතාව පවත්වා ගනිමින් විවිධ තාල අනුව අංග ප්‍රත්‍යාංග හැසිරවීමට හැකි වීම.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : පාද චලන හුරු කරගැනීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.2.1** : 'නැටුමට අවසර ගෙන පාද තබමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 2.2.2** :

- නමස්කාරය දැක්වීමේ දී අනුගමනය කරන විධික්‍රම විස්තර කරයි.
- නමස්කාරය කිරීමේ අපේක්ෂා විස්තර කරයි.
- තම ජීවිතය චරිතායනය කර ගැනීමට දායක වන සජීවී අජීවී දේ අගයමින් නමස්කාරය කරයි.
- නර්තනයේ මූලික අංගහාරයෙහි (මණ්ඩියෙහි) සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- පාසරඹ / මණ්ඩි පද කියමින් තාල තබයි.
- මණ්ඩියෙහි නිවැරදි ඉරියව් හා අංගහාර අනුගමනය කරමින් පාසරඹ/ මණ්ඩි පද හා හමාර පද ඉදිරිපත් කරයි.
- පාසරඹ / මණ්ඩි පද අභ්‍යාසයේ වැදගත්කම ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, රූපසටහන්, DVD පට, VCD පට, නමස්කාරය, සරඹ මණ්ඩි පද ලියූ සටහන

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ශිෂ්‍ය ආකල්ප සංවර්ධනය කිරීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දිය යුතු වේ.

**පියවර 1** :

- "ඔවාද සිප්ප දානේන" යන ගුරු නමස්කාරය සිසුන්ගේ ශ්‍රවණයට සලස්වා කවි ලියූ සටහන් ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග ගායනය කිරීම.
- නමස්කාරය ඉදිරිපත් කිරීමේ අවස්ථා, විධික්‍රම, අපේක්ෂිත අරමුණු, භාවිත වන ඉරියව් හා චලන පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- පදය කියමින් නමස්කාරය අභ්‍යාසයේ යෙදවීම.

**පියවර 2** :

- උගන්නා නර්තන සම්ප්‍රදායෙහි මූලික අංගහාරය (මණ්ඩිය) ප්‍රදර්ශනය කිරීම.
- පාසරඹ/ මණ්ඩි පද නර්තනයේ දී අනුගමනය කරන මූලික ඉරියව්වෙහි සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීම.
- මූලික ඉරියව්වෙහි සිටීමට මග පෙන්වීම.
- නිවැරදි අංගහාර සකස් කිරීම.

**පියවර 3** :

- පාසරඹ/මණ්ඩි පද ලියූ සටහන ප්‍රදර්ශනය කරමින් තාල තබා හඬ නගා කීමට යොමු කරවීම.
- පළමු පා සරඹය/ මණ්ඩි පදය ප්‍රදර්ශනය කිරීම.
- පළමු පා සරඹය / මණ්ඩි පදය කියමින් නර්තනය කිරීමට මග පෙන්වීම හා අභ්‍යාසයේ නිරත කරවීම.
- හමාර පදය ප්‍රදර්ශනය කර නර්තනයට යොමු කර අභ්‍යාසයේ යෙදවීම.

පියවර 4 : • පාසරඹ/මණ්ඩි පද අභාසයේ දී වැදගත්කම හා මූලික අංගහාර අනුගමනය කිරීමෙන් ලැබෙන ශක්‍යතාව පිළිබඳ සාකච්ඡා කරමින්, අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : නර්තන ආරම්භ කරන අවස්ථාවේ දී මෙන් ම අවසන් කරන අවස්ථාවේ දීත් සිසුන් අනුගමනය කරන චාරිත්‍ර පිළිබඳ ඇගයීමට ලක් කළ හැකි ය.

- නමස්කාරය හා බැඳි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- නර්තනයේ මූලික අංගහාරයෙහි (මණ්ඩියෙහි) සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- පා සරඹයක් / මණ්ඩි පදයක් සමග හමාර පදය තාල තබමින් හඬ නගා කියන්න.
- කැමති පා සරඹයක් / මණ්ඩි පදයක් විලම්භ, මධ්‍ය ලයට නර්තනය කර හමාර පදය ඉදිරිපත් කරන්න.

**ගුරු නමස්කාර ගාථාව** :

'ඔවාද සිප්ප දානේන - සික්ඛාපේති මමං ගරූ
සගාරවේන චිත්තේන - අහං වන්දාමි තං ගරූ'

**(ඔවා සිප් දී මෙන - මා හික්මවන ප්‍රේමෙන**
**ඇදුරු හද බැතියෙන - වදිමු ගරු සිත පෙරටු කරගෙන)**

බුදුන්, පොළොව මහී කාන්තාව, දෙවියන් හා දෙගුරුන් නැමදීම.

## උඩරට නර්තන සම්ප්‍රදාය

**නමස්කාර සරඹය** : තෙයියත් තෙයියත් තෙයියත් තාම් ......... ///
තෙයියත් තෙයියත් තෙයියත් තාම්.

**පාසරඹ (උඩරට)** :

01. තෙයි.
02. තෙයි කිට තෙයි තාම්.
03. තෙයි කිට තෙයි කිට තෙයි කිට තෙයි තාම්.

**හමාර පදය** : තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තේයි තාම්
තෙයි තෙයි තත් තත් තා

## පහතරට නර්තන සම්ප්‍රදාය

**නමස්කාර සරඹය** : ගත් දිරිකිට ගුන් දිරිකිට ගත්තත් ගතත් දොං ....... ///

**පාසරඹ** :

01. තෙයි යත් තෙයි.
02. තෙයියත් තෙයි තා.
03. තෙයි කිට තෙයි දොම්.

**හමාර පදය** : තෙයි තෙයි තා කිට තෙයියත් තා.

## සබරගමු නර්තන සම්ප්‍රදාය

| | | |
|---|---|---|
| **මණ්ඩි පද නමස්කාරය** | : | තෙයිතා ගතත්/// තෙයියත් තාම්<br>තේයි තාම් |
| **මණ්ඩි පද** | : | 01. තෙයි<br>02. තෙයි තක<br>03. තෙයි තෙයියත් දොම්/තෙයිතක තෙයියත් දොම් |
| **හමාර පදය** | : | තෙයා ///// තෙයියත් තාම් තේයි තාම් |

| | | |
|---|---|---|
| **නිපුණතාව 2.0** | : | නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. |
| **නිපුණතා මට්ටම 2.3** | : | සරඹ අභ්‍යාසයෙන් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි. |
| **ක්‍රියාකාරකම 2.3.1** | : | 'සාම්ප්‍රදායික නර්තනයට හුරුවෙමු' |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 04 යි. |

**ඉගෙනුම් පල 2.3.2** :

- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද/කස්තිරම්/ ඉරට්ටි හමාර පදය විලම්භ, මධ්‍ය ලයට තාල තබමින් කියයි.
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද විලම්භ, මධ්‍ය ලය අනුව නර්තනය කරයි.
- බෙර වාදනයට අනුව නර්තන හැකියා ප්‍රදර්ශනය කරයි.
- නිවැරදි අංගහාර පවත්වා ගැනීමට ගොඩ සරඹ/ඉලංගම් සරඹ / දොඹින පද අභ්‍යාසය ඉවහල් වන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සරඹ ලියන ලද පත්‍රිකා, බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද 1 සහ 2 සිසුන්ට නැරඹීමට සැලැස්වීම.
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** :

- පළමු ගොඩ සරඹය/ඉලංගම් සරඹය/දොඹින පදය ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින්, අදාළ පද තාල් තබා කීමට සැලැස්වීම.
- පළමු හා දෙවැනි ගොඩ සරඹ/ඉලංගම් සරඹ/ දොඹින පද පියවරෙන් පියවරට ප්‍රදර්ශනය කර අභ්‍යාසයට යොමු කරවීම.
- සරඹ පද නිවැරදි ව හඳුනාගත් පසු බෙර වාදනයටඅනුව නර්තනයේ යෙදවීම.

**පියවර 3** :

- 1-2 ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද බෙර වාදනයට අනුව විලම්භ, මධ්‍ය ලය අනුව අභ්‍යාස කරවීම.

**පියවර 4** :

- පළමු හා දෙවැනි ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද/ කස්තිරම් / ඉරට්ටි හමාර පදය නර්තනයට යොමු කරවීම.
- බෙර වාදනයට අනුව කස්තිරම් / ඉරට්ටි හමාර පදය අභ්‍යාස කිරීම.

**පියවර 5** :

- නර්තන ප්‍රායෝගික කුසලතා වර්ධනයට සහ නිවැරදි අංගහාර පවත්වා ගැනීමට සතතාභ්‍යාසයේ වැදගත්කම සාකච්ඡා කිරීම.
- ක්‍රියාකාරකමෙහි අන්තර්ගත විෂය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ගොඩ සරඹ හා කස්තිරම් /ඉලංගම් සරඹ හා ඉරට්ටි/දොඹින පද හා හමාර පදය අභ්‍යාසයේ වැදගත්කම පිළිබඳ කරුණු 04ක් කෙටියෙන් දක්වන්න.
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද/ විලම්භ, මධ්‍ය ලය අනුව තාල් තබා කියන්න.
- සරඹ හා දොඹින පදවලට අදාළ කස්තිරම්/ඉරට්ටි/ හමාර පදය තාල තබා කියන්න.
- නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගොඩ සරඹ හා කස්තිරම්/ඉලංගම් සරඹ හා ඉරට්ටි/දොඹින පද හා හමාර පදය බෙර වාදනයට අනුව විලම්භ, මධ්‍ය ලය අනුව නර්තනය කරන්න.

## උඩරට නර්තන සම්ප්‍රදාය - ගොඩ සරඹ (අත් සරඹ)

1. අඩිය
   පදය - දොම් කිට කිට දොම්
   කස්තිරම - තත් ජිත් තොං නං තා
2. දැඩිය
   පදය - දොම් කිට කිට දොම්
   කස්තිරම - තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නං තා

## පහතරට නර්තන සම්ප්‍රදාය - ඉලංගම් සරඹ

1. පදය - තෙයි
   ඉරට්ටිය - කිට තා

2. පදය - දිත් තා
   ඉරට්ටිය - දිත ගුඳ තා

## සබරගමු නර්තන සම්ප්‍රදාය - දොඹින පද

නමස්කාරය : තෙයි තා ගතත් ///
තෙයි තෙයි තෙයි ත
තෙයියත් තාම් තේයි තාම්

1. පදය - තෙයි
2. පදය - තෙයි තක

හමාර පදය - තෙයා /////
තෙයියත් තාම් තේයි තාම්

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.4** : නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම 2.4.1** : නර්තනයේ දී සිරුර කෙසේ හසුරු වන්නේදැ යි විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 2.4.2** :

- අංග, ප්‍රත්‍යාංග, උපාංග නම් කරයි.
- නර්තනයේ දී අංග, ප්‍රත්‍යාංග, උපාංග හසුරුවන ආකාරය විස්තර කරයි.
- අංග, ප්‍රත්‍යාංග, උපාංග නිවැරදි ව හසුරුවමින් නර්තන ඉදිරිපත් කරයි.
- නර්තනයේ චමත්කාරය දැනවීමට අංග, ප්‍රත්‍යාංග, උපාංගයන්හි සමායෝජනය වැදගත් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වාද්‍ය භාණ්ඩ, ශ්‍රව්‍ය පට, කාර්ය පත්‍රිකා 1, 2

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- නර්තන අංගයක් ප්‍රදර්ශනය කර එම නර්තන අංගයේ චලන හා ඉරියව්වල ස්වභාවය පිළිබඳ විමසීම. සිසු අදහස් සැලකිල්ලට ගනිමින් නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය අනුව අංග, ප්‍රත්‍යාංග, උපාංග වෙන් කර දැක්වීම.
- නර්තනයේ දී මෙකී කොටස් හසුරුවන ආකාරය එහි සමායෝජනය නර්තනයේ සාර්ථකත්වයට හේතු වන බව හා නර්තන ස්වභාවයන් තීව්‍ර කිරීමට අංග, ප්‍රත්‍යාංග, උපාංග හසුරුවන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- කාර්ය පත්‍රිකා 1 කණ්ඩායම් 03 ට ලබා දී ක්‍රියාකාරකමෙහි නිරත කරවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

**පියවර 3** :

- ගුරු/සිසු කාර්ය පත්‍රිකාව අංක 2 හුණු පුවරුවේ සටහන් කිරීම හා කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොමු කරවීම.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දී වාදනයෙන් සහාය වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

කාර්ය පත්‍රිකාව 2 ට සපයන පිළිතුරු ද ඇගයීමට ලක් කරන්න.

- අංග, ප්‍රත්‍යාංග, උපාංගවලට අයත් කොටස් වෙන් කර දක්වන්න.
- අංග, ප්‍රත්‍යාංග, උපාංග නිසි ලෙස හසුරුවමින් නර්තන අංගයක් ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකාව 1** : A **කණ්ඩායම**

- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද අතරින් එක් සරඹයක්/දොඹින පදයක් ඉදිරිපත් කරන්න.

**B කණ්ඩායම**

- ඔබ ඉගෙනගත් සරඹ/දොඹින පද ඇසුරෙන් අලංකාර මාත්‍රයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

**C කණ්ඩායම**

- ගීතයකට අනුව නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

සැ.යු. එක් කණ්ඩායමක් ඉදිරිපත් කිරීමේ දී සෙසු කණ්ඩායම් එම අංග නිරීක්ෂණය කර ගුරුවරයා විසින් ප්‍රදර්ශනය කර ඇති වගුව සම්පූර්ණ කරන්න.

**ගුරු සිසු කාර්ය පත්‍රිකාව 2 :**

| කණ්ඩායම | අදාළ ක්‍රියාකාරකම | නර්තනයේ දී අංග, ප්‍රත්‍යංග උපාංග හසුරුවන අයුරු විස්තරාත්මක ව |
|---|---|---|
| **A**<br>**B**<br>**C** | | |

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.5** : සාම්ප්‍රදායික චලන භාවිත කරමින් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 2.5.1** : "බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ"

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල 2.5.2** :

- සුළු (මාත්‍රා 2) තනි තිතට අලංකාර පද (මාත්‍රා) දෙකක් නිර්මාණය කරයි.
- අලංකාර පද (මාත්‍රා) නිර්මාණයේ දී නිවැරදි අංගහාර සහ අවකාශය මනා ව භාවිත කරයි.
- තම නිර්මාණ පිළිබඳ අන් අය දක්වන විචාරාත්මක අදහස්වලට සවන් දී තම නිර්මාණ සංවර්ධනය කරගනියි.
- නිර්මාණය කරන ලද අලංකාර පද (මාත්‍රා) සාමුහිකත්වයෙන් යුතු ව ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, බෙර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

6 ශ්‍රේණියේ දී නර්තනය ඉගෙනීම ආරම්භ කරන සිසුන්ට ඇති අත්දැකීම් සැලකිල්ලට ගනිමින් සුළු (මාත්‍රා 2) තනි තිතට අදාළ ව අලංකාර පද දෙකක් (මාත්‍රා 2) නිර්මාණය කිරීමට මග පෙන්වන්න.

පියවර 1 :

- සාම්ප්‍රදායික නර්තන අංගයක් ප්‍රදර්ශනය කරන්න. සම්ප්‍රදාය හා සබැඳි විවිධ චලන භාවිත කරගනිමින් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කළ හැකි බව විස්තර කර සම්ප්‍රදාය හා සබැඳි චලනවල අනන්‍යතා ලක්ෂණ සාකච්ඡා කිරීම.

පියවර 2 :

- අලංකාර පද (මාත්‍රා) 2 ක් නිර්මාණයට සිසුන් යොමු කරවීම.
- සිසුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් විවිධත්වයක් මතුවන පරිදි චලන නිර්මාණ සංවර්ධනය කරගැනීමට උපදෙස් දීම.

පියවර 3 :

- අලංකාර පද (මාත්‍රා) ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම හා ඒ පිළිබඳ අදහස් දැක්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- සාම්ප්‍රදායික චලන යොදා ගනිමින් සුළු (මාත්‍රා 2) තනි තිතට අලංකාර පද දෙකක් (මාත්‍රා 02 ක්) නිර්මාණය කරන්න.
- බෙර වාදනයට අනුව අලංකාර පද දෙකක් (මාත්‍රා 2 ක්) ඉදිරිපත් කරන්න.
- විවිධ නර්තන නිර්මාණ සඳහා අලංකාර පද (මාත්‍රා) යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සරල ව අදහස් දක්වන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.6** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.6.1** : 'වන්නම් ගයමින් නටමු.'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 2.6.2** :

- හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම /අනිලා වන්නමට/ අදාළ පද තාල තබමින් කියයි.
- බෙර වාදනයට අනුව අදාළ වන්නම ගායනය කරයි.
- කස්තිරම/ඉරට්ටිය/කලාසම/ තාල තබමින් කියයි.
- ගායනය කරමින් වන්නම නර්තනය කරයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම නර්තනයේ යෙදේ.
- ඒකල හා සමූහ වශයෙන් සතතාභ්‍යාසයේ යෙදීමෙන් තම කුසලතා වර්ධනය කරගත හැකි බව පවසයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම් පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ගායනය ක්‍රියාකාරකම්වලින් සිසුන් ලබා ගෙන ඇති අත්දැකීම් හා වන්නම මතකයෙන් ගායනය කිරීමේ කුසලතාව පිළිබඳ විමසන්න.

**පියවර 1** :

- වන්නම ගායනය කිරීමට අවස්ථාව ලබා දී අදාළ වන්නම පිළිබඳ ව සරල ව හැඳින්වීම.

**පියවර 2** :

- අංගහාර පිළිබඳ අවධානය යොමු කරමින් ගායනය සමඟ බෙර වාදනයට අනුව වන්නමට අදාළ කොටස් නර්තනය කිරීමට මග පෙන්වීම.

**පියවර 3** :

- උගත් කොටස් ඒකල ව හා සාමූහික ව අභ්‍යාස කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම සාකච්ඡා කිරීම.
- බෙර වාදනයට අනුව ගායනය කරමින් හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නම/ නියමිත අංගහාර සහිත ව අභ්‍යාසයේ යෙදවීම හා ඇගයීමට ලක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : වන්නම, නර්තනය හා ගායනය ඇගයීමේ දී එක් එක් සිසුවාගේ ශක්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය.

- හනුමා වන්නම/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නමට අදාළ බෙර පදය කස්තිරම/ඉරට්ටිය/කලාසම තාල තබමින් කියන්න.
- බෙර වාදනයට අනුව නියමිත අංගහාර අනුගමනය කරමින් වන්නම ඉදිරිපත් කරන්න.
  ප්‍රායෝගික කුසලතා වර්ධනය සඳහා සතතාභ්‍යාස කිරීමේ වැදගත්කම විස්තර කරන්න.
- නියමිත අංගහාර සහිත ව වන්නම සාමූහික ව ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.7** : විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම 2.7.1** : 'ප්‍රස්තාරකරණයේ යෙදෙමු.'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල 2.7.2** :

- මූලධර්ම හඳුනාගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදිය යුතු බව ප්‍රකාශ කරයි.
- බෙර පද/කවි පද හා රබන් පද නියමිත තිත් රූප අනුව ප්‍රස්තාර කරයි.
- ප්‍රස්තාරකරණයේ දී නිවැරදි විධික්‍රම අනුගමනය කරයි.
- තනි තිතේ ප්‍රභේද හඳුන්වයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර පද, රබන් පද හා කවි පද ඇතුළත් ඇමුණුම.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ප්‍රස්තාරකරණය සම්බන්ධ මූලික ක්‍රියාකාරකමට යොදා ගන්නා උදාහරණ සරල විය යුතු අතර වන්නම් නර්තනයෙන් පසු ක්‍රියාකාරකම සැලසුම් කිරීම වඩාත් ඵලදායක ය.

**පියවර 1** :

- මාත්‍රා දෙකේ තනි තිතට යෙදෙන කවියක් ශ්‍රවණයට සැලැස්වීම.
- තිත් තෙයි, සංඥා ලකුණු, විභාග, මාත්‍රා, ආඝාත ආදිය යොදන ආකාරය උදාහරණ සහිත ව විස්තර කරමින් ගායන, වාදන හා නර්තන යන කවර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් වුව ද තාලය මූලික වන බව හා තාලාවබෝධය ලබාගැනීම සඳහා මූලධර්ම හා විධික්‍රම හඳුනාගනිමින් ප්‍රස්තාරකරණයෙහි යෙදිය යුතු බව පැහැදිලි කිරීම.

**පියවර 2** :

- මාත්‍රා 2 තනි තිතට අදාළ කවියක් ප්‍රස්තාර කිරීමට යොමු කරවීම සිසුන් ප්‍රස්තාරකරණයෙහි යෙදෙන විට නිරීක්ෂණය කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

**පියවර 3** :

- සිසු ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- ඉදිරිපත් කරන ලද ප්‍රස්තාර අගයමින් සංවර්ධනයට මග පෙන්වීම.

**පියවර 4** :

- රබන් පද, බෙර පද, ලී කෙළි, කවි පද, කස්තිරම්/ඉරට්ටි/කලාසම් අදාළ සම්ප්‍රදාය අනුව සුළු තනි තිතට (මාත්‍රා 2 තනි තිත) අනුව ප්‍රස්තාර කිරීමට යොමු කරවීම.

**පියවර 5** :

- තනි තිතේ ප්‍රභේද හඳුන්වා දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : සිසුන් තම අභ්‍යාස පොත්වල ඉදිරිපත් කරන ප්‍රස්තාර ඇගයීමට ලක් කිරීම ඉතා වැදගත් බව සලකන්න.

- තනි තිතෙහි ප්‍රභේද නම් කරන්න.
- සුළු (මාත්‍රා 2) තනි තිතට උගත් ගායන, වාදන හා නර්තන කොටස් ප්‍රස්තාර කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 3.1.1** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 3.1.2** :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ නම් කරයි.
- විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරගැනීම සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍ය නම් කරයි.
- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ මගින් විවිධ ශබ්ද, නාද උපද විය හැකි බව ප්‍රකාශ කරයි.
- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිතයට ගත හැකි අවස්ථා නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ගැට බෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම, අත් රබාන, උඩැක්කිය, තාලම්පට හා විකල්ප වාද්‍ය උපකරණ කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ නිරීක්ෂණයට සිසුන් යොමු කිරීම.
- විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් නිර්මාණය කර ඇති සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණවල හඬෙහි විශේෂත්වය හා වාදනය කරන ආකාරය අනුව විවිධ ශබ්ද හා නාද නිපදවිය හැකි බව සාකච්ඡා කිරීම.

පියවර 2 :

- මෙම භාණ්ඩ පරිහරණය කරමින් ඒවා සිසුනට වාදනය කිරීමට අවස්ථාව ලබා දීම.
- විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරගැනීම සඳහා යොදාගත හැකි අමු ද්‍රව්‍ය පිළිබඳ විමසීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03 ක් නම් කරන්න.
- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ නිර්මාණයට යොදා ගෙන ඇති ද්‍රව්‍ය 02ක් නම් කරන්න.
- විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරන්න.

**පසු වැඩ** : විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය රැගෙන ඒමට උපදෙස් දෙන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 3.2.1** : විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල 3.2.2** :

- විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය සඳහා සුදුසු ද්‍රව්‍ය තෝරයි.
- විවිධ ශබ්ද හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි.
- අන් අයගේ නිර්මාණ අගයමින් අදහස් දක්වයි.
- තම නිර්මාණ පිළිබඳ ව අන් අය දක්වන අදහස්වලට ගරු කරයි.

**ගුණාත්මක යෙදවුම්** : විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : සිසුන් රැගෙන එන විවිධ ද්‍රව්‍ය භාවිතයට ගනිමින් විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කිරීමේ දී ශිෂ්‍ය ආරක්ෂාව පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන්න.

**පියවර 1** :

- 3.1.1 ක්‍රියාකාරකමේ දී ඇති උපදෙස් අනුව සිසුන් රැගෙන ආ ද්‍රව්‍ය නිරීක්ෂණය කිරීම.
- එම ද්‍රව්‍ය භාවිත කරමින් නිර්මාණය කිරීමට අපේක්ෂිත විකල්ප වාද්‍ය උපකරණ පිළිබඳ සිසු අදහස් විමසමින්, විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවීම.

**පියවර 2** :

- නිර්මාණය කරන ලද විකල්ප වාද්‍ය උපකරණ ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදීම.
- එම නිර්මාණවල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසු අදහස් විමසීම.
- නිර්මාණය කරන ලද විකල්ප වාද්‍ය උපකරණ වාදනය කිරීමට අවස්ථාව ලබා දීම.
- වාදනය අගයමින් ශබ්ද හා නාදවල ඇති විවිධත්වය හා විකල්ප වාද්‍ය උපකරණ වාදනය කළ හැකි අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- විවිධ ශබ්ද හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරන්න.
- විකල්ප වාද්‍ය උපකරණවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.
- විකල්ප වාද්‍ය උපකරණ වාදනය කළ හැකි අවස්ථා නම් කරන්න.

නිපුණතාව 3.0 : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.3** : විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් ශබ්ද හා නාද නිපදවයි.

**ක්‍රියාකාරකම 3.3.1** : වාදනයෙන් ශබ්ද හා නාද නිපදවමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 3.3.2** :

- විකල්ප වාද්‍ය උපකරණ හසුරුවමින් ශබ්ද නිපදවයි.
- සාමූහිකත්වයෙන් හා අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ව ක්‍රියා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ, විකල්ප වාද්‍ය උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :

- සිසුන් නිර්මාණය කළ විකල්ප වාද්‍ය උපකරණ ලබා දී සිසුන්ගේ අභිමතය පරිදි වාදනය කිරීමට අවස්ථාව ලබාදීම හා සිසු ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම.

පියවර 2 :

- තනි තිතේ තාල රූප අනුව නිපදවිය හැකි විවිධ ශබ්ද හා නාද පිළිබඳ සාකච්ඡා කර සුළු (මාත්‍රා 2) තනි තිතට බෙර පදයක් වාදනය කර, ඒ අනුව ශබ්ද හා නාද නිපදවීමට සැලැස්වීම.

පියවර 3 :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් නාද හා ශබ්ද නිර්මාණය කිරීමට යොමු කරවීම.
- මේ ආකාරයට මැදුම් (මාත්‍රා 3) හා මහ (මාත්‍රා 4) තනි තිත තාල රූපවලට අනුව වාදනය කිරීමට සැලැස්වීම හා අභ්‍යාස කිරීමට මග පෙන්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් තනි තිතේ තාල රූප අනුව විවිධ නාද හා ශබ්ද ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාදන භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.4** : තේමාවට අනුව සමූහ වාදන ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 3.4.1** : ශබ්ද නාද මුසු කරමින් මවමු දුම්රියක්.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 3.4.2** :

- තේමාවට අනුකූල ව වාදනය නිර්මාණය කිරීමට ගැළපෙන වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ තෝරයි.
- විධික්‍රම අත්හදා බලමින් ශබ්ද හා නාද නිර්මාණය කරයි.
- තේමාවට අනුව සමූහ වාදන ඉදිරිපත් කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව හා ප්‍රාසංගික ව සමූහ වාදන අංගයක් ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ, විකල්ප වාද්‍ය උපකරණ, දුම්රියේ ශබ්ද හා නාද ඇතුළත් සංයුක්ත පටයක්, කෝච්චිය හා බැඳි ගීතයක්, ඇමුණුම 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :

- දුම්රිය ක්‍රියාකාරිත්වය අනුව ඇසෙන ශබ්ද හා නාද ඛණ්ඩ කීපයක් ඇතුළත් සංයුක්ත පටයක් /ඒ හා සම්බන්ධ ගීතයක් ශ්‍රවණයට සලස්වා, සිසු අදහස් විමසමින්, දුම්රිය ක්‍රියාකාරිත්වයේ විවිධ අවස්ථා, එම අවස්ථාවන්හි දී ඇසෙන ශබ්ද හා නාද, එම ශබ්ද හා නාද නිපදවිය හැකි සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ තෝරාගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2 :

- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ තෝරා ගෙන කණ්ඩායම් අතර බෙදා දී, ඇමුණුම 1 හි සඳහන් ක්‍රියාකාරකම නිර්මාණය කිරීමට සිසුන් යොමු කිරීමට මග පෙන්වා උපදෙස් ලබාදීම.

පියවර 3 :

- කණ්ඩායම් සමූහ වාදන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඒවා ඇගයීමට ලක් කර, සංවර්ධනාත්මක යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදීම.

පියවර 4 :

- හඬ පාලනය
- නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කිරීම.
- ප්‍රාසංගික බව.
- අවධානයෙන් හා සංයමයෙන් යුතු ව සමූහ වාදන ඉදිරිපත් කිරීම හා මෙවැනි කාර්යයන්හි නියැළීමෙන් ලැබෙන ශක්‍යතා පිළිබඳ සිසුන් දැනුවත් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : සිසු ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරමින් තක්සේරු කරන්න. අවශ්‍ය මග පෙන්වීම් කර ඇගයීම සැලසුම් කරන්න.

- තේමාවට අදාළ ව පෙළ ගස්වන ලද අවස්ථා ශබ්ද හා නාද ඇසුරින් සමූහ වාදනයක් නිර්මාණය කරන්න.
- සාමූහිකත්වයෙන් යුතු ව ප්‍රාසංගික ව සමූහ වාදනය ඉදිරිපත් කරන්න.

ඇමුණුම 1 :

- ගමන ආරම්භය - නලාව ශබ්දය
- කඳු නැගීම
- පල්ලම් බැසීම
- බිං ගෙයක් තුළින් ගමන් කිරීම
- තැනිතලා බිමක ගමන් කිරීම
- ගමනාන්තය,

  යන අවස්ථා උපයෝගී කරගනිමින් ශබ්ද හා නාද මතු කරමින් තේමාවට අදාළ වාදනයක් නිර්මාණය කරන්න.
  ඉහත අවස්ථා අවශ්‍ය පරිදි සංවර්ධනය කර ගත හැකි ය.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.1** : නියමිත ගායනවල සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 4.1.1** : ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 4.1.2** :

- නැළවිලි කවි ගායනය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම.
- ලී කෙළි හා කළගෙඩි නැටුම්වලට අදාළ කවි ගායනවල සංස්කෘතික පසුබිම විස්තර කරයි.
- දේශීය වන්නම්, ගායනය සඳහා රචනා වී ඇති බව ප්‍රකාශ කරයි.
- ලී, කෙළි හා වන්නම් කවි රචනාවන් පිළිබඳ අගයමින් අදහස් දක්වයි.
- අදාළ කවි ගායන සංරක්ෂණය කරගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, කවි හා වන්නම ලියනලද දෘශ්‍යාධාරය

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- මෙම ක්‍රියාකාරකමෙහි අන්තර්ගත කවි පිළිබඳ සංස්කෘතික පසුබිම අදාළ ගායන අවස්ථාවේ දීත් සාකච්ඡා කිරීමට සැලසුම් කර ගත හැකි බව සලකන්න.

**පියවර 1** :

- නැළවිලි කවියක්, ලී කෙළි කවියක්, කළගෙඩි නැටුමේ කවියක් හා වන්නමේ කවියක් ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් එක් කවියක් ගායනය කිරීම.
- දෘශ්‍යාධාරයේ දැක්වෙන කවි ගායන කරන අවස්ථා එම ගායන නිර්මාණයට තුඩුදුන් හේතු, අනන්‍යතා ලක්ෂණ, සුවිශේෂ වටිනාකම් හා සංරක්ෂණය සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම හා, අදාළ විෂය කරුණු සටහන් කරගැනීමට අවස්ථාව සැලසීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : ගායන ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ දී අදාළ කවි හා වන්නම් පිළිබඳ ඇගයීම සැලසුම් කිරීමේ අවකාශය ඔබට ඇත.

- නැළවිලි කවි ගායනය පිළිබඳ අගයමින් වාක්‍ය 02 ක් ලියන්න.
- ලී කෙළි හා කළගෙඩි නැටුමේ කවි අසන්නට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න.
- එම ගායනවල සුවිශේෂ ලක්ෂණ දෙකක් ඉදිරිපත් කරන්න.
- ජන ගායන සංරක්ෂණය කිරීම සඳහා සුදුසු යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න.

විවිධ ජීවන වෘත්තීන්හි නිරත වූ ගැමි ජනයා, එම වෘත්තීන්හි නිරත වන අවස්ථාවල දී ඇති වන විඩාව කාන්සිය දුරු කරගැනීමටත්, ආගමික හා සාමාජීය උත්සව අවස්ථාවල දී භක්තිය සතුට හා විනෝදය උදෙසාත් කවි ගායනය කර ඇත. මෙම කවිවල භාෂාව, නාද රටාව, අර්ථය හා තාල සරල ය. කවිවල අන්තර්ගතය විමසීමේ දී ගැමි ඇදහිලි, විශ්වාස, සහජීවනය මෙන් ම වෘත්තියට අදාළ මෙවලම් පිළිබඳ සරල ව විස්තර කර ඇත. ඇතැම් කවි මගින් වෘත්තීයමය ක්‍රියාකාරකම් තොරතුරු හා ඊට සැරසුණු ආකාරයත් පිළිබිඹු කෙරේ. ගැමි ගායනාවන්හි නාද රටා ප්‍රාදේශීය වෙනස්කම්වලින් යුක්ත අතර දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරේ.

දේශීය වන්නම් මුල් යුගයේ දී ගායනය සඳහා රචනා වී තිබු බව එම වන්නම් රචනා පිළිබඳ විමසීමේ දී හඳුනාගත හැකි ය. එක් එක් සම්ප්‍රදායට අයත් වන්නම් රචනා වී ඇති යුග හා පරමාර්ථ අතර වෙනස්කම් පවතී. පසු කාලයේ දී වන්නම් නර්තන සඳහා යොදාගෙන ඇති අතර ඒවා සාම්ප්‍රදායික නර්තනාංග බවට විකාශනය වී ඇත.

දෙමව්පියන් තම නිවසේ දී දරුවන් නැළවීමට කවි ගායනය කර ඇත. ඉතා ලයාන්විත ව ගයන නැළවිලි කවි සෑම ජන කොට්ඨාශයකට ම පොදු ය. මව් පිය සෙනෙහස (දරු සෙනෙහස) හා දරුවන් සනසාලීමට නැළවිලි කවි ගායනය කර ඇත.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත තිත්රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2.1** : නැළවිලි කවි ගයා රස විඳිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි.

**ඉගෙනුම් පල 4.2.2** :

- නිවැරදි නාද රටා අනුගමනය කරමින් නැළවිලි කවි ගායනය කරයි.
- නැළවිලි කවි ගායනයෙහි සුවිශේෂ ලක්ෂණ ඇති බව පවසයි.
- නැළවිලි කවි ගායනය කිරීමේ අවස්ථා හා අරමුණ විස්තර කරයි.
- සාමූහික ව හා ඒකල ව ස්වකීය හඬ පාලනය කරමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, බෙර, නැළවිලි කවි ඇතුලත් පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- මෙම නැළවිලි කවි ගායනය ඉතා ළයාන්විත ව ඉදිරිපත් කළ යුතු වේ. විවිධ ක්‍රම ශිල්ප හා සම්පත් භාවිත කරමින් ක්‍රියාකාරකම සැලසුම් කර ගන්න.

පියවර 1 :

- නැළවිලි කවියක් ශ්‍රවණය කිරීමට සලස්වා සිසු අදහස් විමසමින් නැළවිලි කවි රචනා කිරීම, එහි සුවිශේෂ ලක්ෂණ, ගායනය කිරීමේ අවස්ථා පිළිබඳ තොරතුරු විමසීම.

පියවර 2 :

- නැළවිලි කවි ලියූ පත්‍රිකා සිසුන්ට ලබාදී, නැළවිලි කවි ගායනය කර නාද රටාව හඳුන්වා දීම. නාද රටා අනුගමනය කරමින් ගායනය කිරීමට සිසුන් යොමු කරවීම.

- දී ඇති නැළවිලි කවි අතරින් සිසුන් වඩාත් කැමති නැළවිලි කවි තෝරා සාමූහික ව හා ඒකල ව ගායන අභ්‍යාස කරවීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : නැළවිලි කවි කිහිපයක් අතරින් තෝරා ගන්නා ලද මෙන් ම උගන්වා ඇති කවි ඇගයීමට ලක් කරන්න.

- නැළවිලි කවි ගායනය කිරීමේ අවස්ථාවක් විස්තර කරන්න.
- නියමිත නාද මාලා අනුගමනය කරමින් කැමති නැළවිලි කවියක් ගායනය කරන්න.

## නැළවිලි කවි

| | |
|---|---|
| දොයි දොයි දොයි දොයිය | බබා |
| බයි බයි බයි බයි | බබා |
| | |
| නුඹෙ අම්මා කොතැන | ගියේ |
| කිරි එරවා එන්ට ගියේ | ගියේ |
| කිරි මුට්ටිය ගඟේ | ගියේ |
| ගඟට උඩින් කොක්කු | ගියේ |
| | |
| අතට වෙරළු ඇහිද | ගෙනේ |
| ඉනට පලා නෙලා | ගෙනේ |
| බරටම දර කඩා | ගෙනේ |
| එයි අම්මා විගස | කිනේ |
| | |
| දෝයි අම්මා දොයි | දොයියෝ |
| බායි අම්මා බායි | බයියෝ |
| | |
| මුනිසිරිපා සිඹිමින් | නේ |
| සමනොළ ගිර පෙදෙසින් | නේ |
| මඳ සුළඟයි මේ එන් | නේ |
| මගේ පුතා නැළවෙන් | නේ |
| | |
| ලොවේ පුතුන් බොහෝ | ඇතා |
| වඩා නැළෙව්වත් | හඬතා |
| මගේ පුතා එහෙම | නැතා |
| නාඩා නැළවෙන්න | පුතා |
| | |
| ඔන්න බබෝ | ඇතින්නියා |
| ගල් අරඹේ | සිටින්නියා |
| ගලින් ගලට | පනින්නියා |
| බබු දූකලා | දුවන්නියා |

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත තිත්රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2.2** : ලී කෙළි හා කළගෙඩි කවි ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 4.2.2** :

- නිවැරදි නාද රටා අනුගමනය කරමින් ලී කෙළි කවි තාල තබා ගායනය කරයි.
- නිවැරදි නාද රටා අනුගමනය කරමින් කළගෙඩි කවි ගායනය කරයි.
- නිවැරදි අක්ෂර උච්චාරණය කරමින්, බෙර වාදනයට අනුව අදාළ කවි ගායනය කරයි.
- හඬ පාලනය කර ගනිමින් ඒකීය හඬ තලයක පිහිටා සාමූහික ව ගායනය කරයි.
- ස්වකීය හඬතලය හඳුනාගනිමින් ඒකල ගායනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, දෘශ්‍යාධාර, බෙරය, තාලම්පට.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : කාලච්ඡේද සැලකිල්ලට ගනිමින් අදාළ කවි හා සබැඳි ඉගෙනුම් පල වෙන් කර ක්‍රියාකාරකම් සැලසුම් කරන්න.

පියවර 1 :

- ලී කෙළි කවියක් ශ්‍රවණයට සැලැස්වීම හා ලී කෙළි කවි පසුබිම පිළිබඳ ව සිසුන්ගේ පෙර දැනුම පිරික්සීම.
- ලී කෙළි කවි පදයට තාල තැබීමට යොමු කරවීම.
- ලී කෙළි කවියේ පද එක බැගින් ශ්‍රවණයට සැලැස්වීම හා ගායනයට යොමු කරවීම.

පියවර 2

- ලී කෙළි කවි සාමූහික ව හා ඒකල ව ගායනය කර අභ්‍යාසයට යොමු කරවීම. බෙර වාදනයට අනුව ගායනය කරවීම.

පියවර 3 :

- සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් කළගෙඩි කවි ද ගායනය කරවීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ලී කෙළි කවියක් හා කළගෙඩි නැටුමේ කවියක් ගායනය කරන්න.
- ලී කෙළි සහ කළ ගෙඩි කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ කෙටියෙන් දක්වන්න.
- මෙම කවි ගායනා සංරක්ෂණය කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

## ලී කෙළි කවි

1. එක පඳුරෙන් ලී සයක් කපා ගෙන
එක උස ඇති සදෙනෙක් තෝරා ගෙන
ගුරුන් අතට දී ලී බෙදවා ගෙන
අපිත් කෙළිමු ලී දෙපිල සැදී ගෙන

2. අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි
පොළවේ දෙවියෝ බිම වැඳ ගන්නයි
සතර වරම් දෙවි බලා සිටින්නයි
අද ලී කෙළියෙන් අප දිනවන්නයි

3. ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා
සඳට ඔබිය සඳවට තරු සිටියා
ලියට ඔබිය සුදු සේලය නෙරිය
අපට ඔබිය සබ මැද ලී කෙළියා

## කළගෙඩි කවි

1. පේළි සැදී අඟනෝ සැරසීලා
නීල වරළ කුසුමන් ගවසාලා
කෝල නොවී සබ මැදට වැදීලා
බාල ලියෝ කළ පිඹිති සැදීලා

2. ජලේ සොදයි බැසලා පීනන්නට
විලේ සොදයි මල් ගැබ මෝරන්නට
මිලේටවත් කළ දීලා ගන්නට
කළේ සොඳයි මේ ළඳට පිඹින්නට

3. ලත් පමණට මැටි ඉඳිකරවා ගෙන
පත් බිඳලා කළ ගෙඩි සදවා ගෙන
අත් නැරම කළගෙඩි තෝරා ගෙන
සිත් සතොසින් කළ පිඹිමු සැදී ගෙන

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.3** : නියමිත තිත්රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.3.1** : වන්නම් ගායනය ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි.

**ඉගෙනුම් පල 4.3.2** :

- නිවැරදි වචන උච්චාරණය කරමින් වන්නම් ගායනය කරයි.
- වන්නම් ගායනයට ආවේණික නිවැරදි නාද රටා අනුගමනය කරමින් ගායනය කරයි.
- තාලම්පට වාදනය කරමින් වන්නමෙහි බෙර පදය කියයි.
- හනුමා/හනුමන්තා තාලය සින්දු වන්නම/ අනිලා වන්නම සුළු (මාත්‍රා 2) තනි තිතට අනුව නර්තනය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- ඒකීය හඬතලයක පිහිටා සාමූහික ව ගායනය කරයි.
- ස්වකීය හඬ තලය හඳුනාගනිමින් ඒකල ගායනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, දෘශ්‍යාධාර, බෙරය, තාලම්පට.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : තමා උගන්වන සම්ප්‍රදායට අදාළ ව ක්‍රියාකාරකම සැලසුම් කර ගන්න.

පියවර 1 :

- වන්නම් ගායනයක් ශ්‍රවණයට සැලැස්වීම හා වන්නම් ගායනය හා සබැඳි පසුබිම පිළිබඳ දැනුම පිරික්සීම.
- අදාළ වන්නමෙහි බෙර පදය වාදනය කිරීම, තාල තැබීමට සිසුන් යොමු කරවීම හා තාලය හඳුන්වාදීම.
- වන්නමෙහි තානම තාල තබමින් ගායනය කිරීමට යොමු කරවීම.
- වන්නමේ එක් කවි පදය බැගින් ගායනය කර ශ්‍රවණයට සලස්වා, සිසුන් ගායනයට යොමු කරවීම.

පියවර 2 :

- කණ්ඩායමක් ලෙස සාමූහික ව ඒකීය හඬ තලයක පිහිටා ගායනය කිරීම මෙන් ම, ස්වකීය හඬ තලය හඳුනාගනිමින් ඒකල ව ගායනය කිරීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- උගත් වන්නමෙහි තාල රූපය නම් කරන්න.
- තාල තබමින් වන්නම ගායනය කරන්න.

## උඩරට - හනුමා වන්නම

| | | |
|---|---|---|
| තාලය | : | සුළු (මාත්‍රා 2) තනි තිත |
| බෙර පදය | : | කුඳ ගත ගත දොං |
| තානම | : | තනම් දනත් තම් දනත් තනම් දන<br>තනම් දනත් තනෙනා .................... තෙයි<br>තනම් දනත් තම් දනත් තනම් දන<br>තනම් දනත් තනෙනා ............. |
| කවි | : | ගිරින් ගිරට පැන ලැගුම් සොයා පුබුදිමින්<br>අරුණ කළ මා ............... ගොර<br>දෙමින් නැවත වට පිටින් බලති නෙක<br>උසුළු විසුළු පුදුමා<br>එයින් නැවත පලතුරින් තුරට පැන<br>මලින් එල ද දලු මා ............... අත<br>දෙමින් රැගෙන කට කොණින් බුදිතිවට<br>පිටින් බියැති බැලුමා<br><br>දුටින් අයෙක් සට පටින් පැනුම් රැලි<br>පොටින් නෙරා හෙවුමා.................. බය<br>දුටින් එවිට අතුපතින් වසා මුව<br>ඉතින් නැතෙයි පෙනුමා<br>මතින් උඩගු සිත ගතින් වැඩිව පෙර<br>පැතුම් විලස දැරුමා ................. නැණ<br>යකින් මෙලෙස ඉසිමතින් යෙදුව පෙර<br>මෙවන් වරුණ හනුමා |
| කස්තිරම | : | රුංතක ජිංතක තරිකිට කුංදත්<br>තාග් ග ජිංතක තරිකිට කුංදත්<br>රුංතක ජිංතක තරිකිට කුංදත් තා |

## සබරගමු - අනිලා වන්නම

| | | |
|---|---|---|
| තාලය | : | සුළු (මාත්‍රා 2) තනි තිත |
| දවුල් පදය | : | ජිංත ජිමිත්තත් තක්කිට කිටිතක/// <br> ජිංත ජිමිත්තත් තිත් තෙයි |
| තානම | : | තනෙනා තන තාන තනම්දන <br> තනෙනා තන තම්දන තානා // |
| කවිය | : | එකලා මහ රාජ නරාදිප වැඩලා සිට <br> සිංහාසන පිට <br> අනිලා හඬ දෙන මෙන් ගුවනට කියලා යන <br> නාද අසා සිට <br> දැකලා කිවි නළුවෝ වැඩ සිට එකලා කී <br> වන්නම පෙර සිට <br> අනිලා වන්නම අණ මුල් කොට පවන් වේගයෙන් <br> කීවේ මෙලෙසට |
| කලාසම | : | ජිමිකිට කිටිතක තරිකිට කිටිතක /// <br> ගතිත කුදිත්තත් |

## පහතරට - හනුමන්තා තාලය සින්දු වන්නම

| | | |
|---|---|---|
| තාලය | : | සුළු (මාත්‍රා 2) තනි තිත |
| බෙර පදය | : | ගතිකිට ගත දොම් ගුදිකිට ගත දොම් |
| තානම | : | තෙනෙනම් තෙන තෙනෙනා-තෙනම්තෙන <br> තෙනෙනම් තෙන තෙනෙනා |
| කවිය | : | සත රකිනේ අන් අකුසෙ දිනේ දිලි රන්තලිනේ නව පලු විලසේ <br> නෙත රකිනේ පත් කුසුම රොනේ ගත් බිගු ලෙසිනේ මිණි බරණ දිසේ <br> නිතර රනේ ගත් සිත සොඳිනේ විස්කම් සුරිඳේ ගත් තුගු පලසේ <br> සතත දිනේ දෙව්රජ සිරිනේ සිය කුල දෙරණේ වැඩි සුරතුරසේ |
| ඉරට්ටිය | : | ගතිකිට ගතදොං ගදිත ගුගුද තරි තත් දිත් තොං නං <br> ගුහිති ගදිරිකිට ගත්තත් දොම්තක දිකුදක දැහිම් |

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.1** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා බැඳි සාරධර්ම අගයමින් අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම 5.1.1** : 'ගුරු ගෙදර හා බැඳි සාරධර්ම සුරකිමු.'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 5.1.2** :
- ගුරු ගෙදර නර්තන අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ගුරු ගෙදර අධ්‍යාපනයේ දී අනුගමනය කරන චාරිත්‍ර විස්තර කරයි.
- ගුරු ගෙදර අධ්‍යාපනයේ දක්නට ලැබෙන චාරිත්‍ර හා සබැඳි සාරධර්ම පිළිබඳ අදහස් දක්වයි.
- සාරධර්ම අනුගමනය කරමින් ජීවත්වීමට හා යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට නර්තන ක්‍රියාකාරකම් ඉවහල් වන බව ප්‍රකාශ කරයි.
- නර්තන අධ්‍යාපනයෙන් වර්ධනය කරගත් සාරධර්ම අනුගමනය කරමින් ජාතික අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගුරු වන්දනා කවි ලියන ලද සටහන.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :
- සාම්ප්‍රදායික නාද මාලාවට අනුව ගයන ගුරු වන්දනා කවියක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම./ගායනය කරවීම.
- ගායනය කරන ලද කවියෙහි අන්තර්ගතය හා ගුරු ගෙදර නර්තන අධ්‍යාපනය හා බැඳි සුවිශේෂ සාරධර්ම, නර්තන අධ්‍යාපනය හා බැඳි ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රදර්ශනය කළ හැකි බව සාකච්ඡා කිරීම.

**පියවර 2** : ගුරු ගෙදර අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියක් සකස් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- නර්තනය ඉගෙන ගන්නා පන්ති කාමරය තුළ දී අනුගමනය කරන චාරිත්‍ර විධි දෙකක් විස්තර කරන්න.
- සාරධර්ම ජීවිතයට පුරුදු පුහුණු කරගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමයන් රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.2** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායවල තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.2.1** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 5.2.1** :

- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් නම් කරයි.
- එම නර්තන සම්ප්‍රදායන් ප්‍රභවය ලත් ප්‍රදේශ නම් කරයි.
- නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරයි.
- සම්ප්‍රදායට අයත් රංග වස්ත්‍රාභරණ කට්ටල නම් කරයි.
- උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායවල මූලික අංගහාරයන් ප්‍රදර්ශනය කරයි.
- එක් එක් සම්ප්‍රදායවලට අයත් ශාන්තිකර්ම නම් කරයි.
- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් ජාතික උරුමයක් ලෙස අගය කරමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : රූප සටහන් / දෘශ්‍ය පට / වාද්‍ය භාණ්ඩ, ඇමුණුම 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- ගුරුවරයා/දෘශ්‍ය පටයක් භාවිත කර උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායවලට අයත් සරල නර්තන කොටසක් හෝ මූලික අංගහාරය ප්‍රදර්ශනය කිරීම.
- ඒ පිළිබඳ සිසුන් දක්වන ප්‍රතිචාර අනුව නර්තන සම්ප්‍රදායන් තුන පිළිබඳ ව මූලික තොරතුරු හඳුන්වා දීම.
- ඇමුණුම 1 සිසුන් අතර බෙදා පිළිතුරු සැපයීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

**පියවර 2** :

- කාර්ය පත්‍රිකාවට අනුව සිසු පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. එම පිළිතුරු සැලකිල්ලට ගනිමින් ශිෂ්‍ය සාධන මට්ටම් හඳුනාගැනීම.

**පියවර 3** :

- රූප සටහන්, දෘශ්‍ය පට, වාද්‍ය භාණ්ඩ භාවිත කරමින් නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වය පිළිබඳ කරුණු දැක්වීම.
- ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රදර්ශනය කෙරෙන නර්තන සම්ප්‍රදායන් රැකගැනීමේ වැදගත්කම සාකච්ඡා කිරීම.
- අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට යොමු කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ලංකා සිතියමක ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වය ප්‍රභවය ලත් ප්‍රදේශ ලකුණු කරන්න.
- එක් එක් සම්ප්‍රදායට අදාළ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
- ඔබට බහුල ව දක්නට ලැබෙන නර්තන අංග නම් කර ඒවා කුමන නර්තන සම්ප්‍රදායට අයත් දැයි ලියන්න.
- මෙම නර්තන සම්ප්‍රදායන් රැකගැනීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වමින් පාසල් බිත්ති පුවරුවට කෙටි ලිපියක් ඉදිරිපත් කරන්න.

**පසු වැඩ** :

- එක් එක් සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

**ඇමුණුම 1**

| ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් නම් කරන්න. | ................ සම්ප්‍රදාය | ................ සම්ප්‍රදාය | ................ සම්ප්‍රදාය |
|---|---|---|---|
| එම සම්ප්‍රදාය ත්‍රිත්වය ප්‍රභවය ලත් ප්‍රදේශ නම් කරන්න. | | | |
| එම සම්ප්‍රදායවලට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න. | | | |
| එම සම්ප්‍රදායවලට අයත් රංග වස්ත්‍රාභරණ කට්ටල නම් කරන්න. | | | |
| එක් එක් සම්ප්‍රදායට අයත් ඔබ දන්නා ශාන්තිකර්ම ලියන්න. | | | |

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක ශිල්පීන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.3.1** : නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**සුවිශේෂ ඉගෙනුම් පල 5.3.2** :

- නර්තනයේ ප්‍රවර්ධනයට ඔවුන් දායක වී ඇති ආකාරය විස්තර කරයි.
- ඔවුන්ගේ සේවය අගයමින් අදහස් ප්‍රකාශ කරයි.
- පරපුරෙන් පරපුරට දේශීය නර්තන සම්ප්‍රදායන් සුරැකීමට යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශිල්පීන්ගේ ඡායාරූප, පින්තූර, තොරතුරු සඳහන් පොත්පත්, ඇමුණුම 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- නිත්තවෙල ගුණයා, එන් ඒ. සිරිබෝහාමි හා එස් එච්. සව්රිස් සිල්වා යන ශිල්පීන්ගේ ඡායාරූප/පින්තූර ප්‍රදර්ශනය කර ඔවුන් හඳුනාගැනීමට අවස්ථාව ලබා දී, සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් අදාළ ශිල්පීන්ගේ ජීවන තොරතුරු, ශිල්පීය කුසලතා හා නර්තන කලාවේ ප්‍රගමනයට ලැබුණු දායකත්වය පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** : සාකච්ඡා කරන ලද තොරතුරු සටහන් කරගැනීමට මග පෙන්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන ශිල්පීන් තිදෙනා අයත් වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.
- ශ්‍රී ලාංකේය නර්තනයේ ප්‍රගමනයට නිත්තවෙල ගුණයා මහතා, එස්.එච්. සව්රිස් සිල්වා මහතා, එන්.ඒ. සිරිබෝහාමි මහතා විසින් ඉටු කළ සේවාවන් කෙටියෙන් සඳහන් කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.1** : සබරගමු සමන් දේවාල පෙරහර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.1.1** : සමන් දේවාල පෙරහර අසිරිය පවසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල 6.1.2** :

- සබරගමු සමන් දේවාල පෙරහර හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- පැවැත්වීමේ හේතු හා චාරිත්‍ර විධි නම් කරයි.
- පෙරහරක දක්නට ලැබෙන නර්තන, වාදන අංග හා වෙනත් විශේෂාංග වෙන් කොට දක්වයි.
- විවිධ (ඇසළ) පෙරහර පිළිබඳ තොරතුරු එක් රැස් කරයි.
- පෙරහැර සාමූහික සංස්කෘතික කලා අංගයක් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දවුල / තම්මැට්ටම, ඇමුණුම 1, කාර්ය පත්‍රිකා 1,2,3,4
සමන් දේවාල පෙරහර DVD පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : සමන් දේවාල පෙරහර පිළිබඳ තොරතුරු රැස්කිරීමට සිසුන් යොමු කර පෙර සූදානමක් ඇති ව මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.

**පියවර 1** :

- සමන් දේවාල පෙරහර DVD පට ප්‍රදර්ශනය කිරීම හා ඒ පිළිබඳ විමසීම.
- සබරගමු සමන් දේවාල පෙරහර හා සබැඳි ඓතිහාසික පසුබිම, පෙරහර පැවැත්වීමේ හේතු, පෙරහර හා බැඳි චාරිත්‍ර, සුවිශේෂ කාර්යයන්, නර්තන, ගායන, වාදන, වෙනත් විශේෂාංග හා රංග වස්ත්‍රාභරණ, පෙරහර හා සමාජ සම්බන්ධතා පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** :

- කණ්ඩායම් අතර ඇමුණුම 1 හා කාර්ය පත්‍රිකා 04 බෙදා දී, කාර්ය පත්‍රිකාවට අනුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවීම.

**පියවර 3** :

- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ අදහස් දක්වමින් අවශ්‍ය විෂය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : කාර්ය පත්‍රිකාවල අසා ඇති ප්‍රශ්නවලට සිසුන් ලබා දී ඇති පිළිතුරු සලකා බැලීම ඉතා වැදගත් ය.

- පෙරහැර හා සබැඳි චාරිත්‍ර නම් කරන්න.
- නර්තන, වාදන හා වෙනත් විශේෂාංග යන ශීර්ෂ ඔස්සේ පෙරහරෙහි දැකිය හැකි අංග වෙන් කර දක්වන්න.

පැවරුම : සපයාගත් තොරතුරු ඇසුරෙන් ඇසළ පෙරහර පිළිබඳ පහත (ඉගැනුම් දීර්ඝ කිරීම) සඳහන් ශීර්ෂ යටතේ පොත් පිංචක් නිර්මාණය කරන්න. පැවැත්වීමට හේතු, චාරිත්‍ර විධි, නර්තන අංග, වාදන අංග, රංග වස්ත්‍රාභරණ, වෙනත් විශේෂාංග

**ඇමුණුම 1**

## රත්නපුර මහ සමන් දේවාල ඇසළ පෙරහර

වාර්ෂික ව පවත්වනු ලබන පෙරහරවල් අතර, රත්නපුර මහ සමන් දේවාලය මුලිකත්වයේ ලා සිදු කරන ඇසළ පෙරහර ප්‍රධාන ස්ථානයක් ගනී. **දඹදෙණියේ රජකළ I වැනි පැරකුම්බා රජුගේ ඇමතියකු වන ''ආර්ය කාමදේව'' නමැත්තා විසින් ක්‍රි: ව: 1228 දී පමණ මෙම දේවාලය කරවන ලද බව පැවසේ.**

පෘතුගීසි ආක්‍රමණවලින් පසු ව මෙම දේවාලය ප්‍රතිසංස්කරණය කරන ලද්දේ **II වන රාජසිංහ රජු විසිනි.** මෙම දේවාලයේ වාර්ෂික චාරිත්‍ර අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නේ ඇසළ පෙරහර මංගල්‍යය යි. අගෝස්තු මාසයේ පවත්වනු ලබන මෙම චාරිත්‍රය සඳහා දේවාලයේ සියලු ම නිලපංගුකරුවෝ සහභාගි වෙති. ඇතුල් කට්ටල හා පිට කට්ටල නිලධාරීන්, සේවා භාරකරුවන් විසින් මෙම පෙරහර චාරිත්‍ර පවත්වනු ලැබේ. දේවාලයේ පරිපාලන නිලධාරීන් වන බස්නායක නිලමේ, මොහොට්ටාල ලේකම්, විදානේ, කංකානම යන පිරිස් පෙරහර සංවිධානය කරති.

පෙරහරේ පළමු චාරිත්‍රය **කප් සිටුවීම** යි. මෙහි දී කුඹල් කුලයට අයත් පුද්ගලයකු වලං කදක් ගෙන ඒම විශේෂ චාරිත්‍රය වේ. කප් සිටුවීම සිදුකරන දින සිට දින 5ක් උඩමළුවේ පැවැත්වෙන කුඹල් පෙරහරේ මෙම පුද්ගලයා (බඩහැල බද්දා) ගමන් කරනු ලබන්නේ ඔහුගේ මුහුණ ආවරණය කරගෙන ය.

කුඹල් පෙරහර දින 5ක් පැවැත් වූ පසු වීදි පෙරහර හෙවත් දෙවේලේ පෙරහර දින 5ක් පවත්වනු ලබයි. එය සමන් දේවාල භූමියේ වීදි පහේ ම ගමන් කරනු ලැබේ. ඉන්පසු අවසන් දින පහේ රන්දෝලි පෙරහර පැවැත්වේ. එම පෙරහර ද දේවාල භූමියේ වීදි පහේ ම සංචාරය කරනු ලබන ප්‍රධාන පෙරහර මංගල්‍යය ලෙස හැඳින්විය හැකි ය. දේවාලයේ වීදි පහ ලෙස

1. උඩ වීදිය
2. කුඹල් වීදිය
3. ගම්පහ වීදිය
4. හුණුවල වීදිය
5. සංහිදේ වීදිය ලෙස හැඳින්වේ.

සමන් දේවාල පෙරහර, පෙරහර පහකින් සමන්විත ය.

1. දළදා පෙරහර
2. පත්තිනි පෙරහර
3. බිසෝ පෙරහර
4. කුමාර පෙරහර
5. සමන් දෙවිරජ පෙරහර යනුවෙනි.

රන්දෝලි පෙරහරට පෙර පැවැත්වෙන තවත් සුවිශේෂ චාරිත්‍රයක් ලෙස දේවාභරණ නානුමුර කිරීමේ චාරිත්‍රය වන නානුමුර මංගල්‍යය හැඳින්විය හැකි ය. එහි දී බෝධිනාගල නයිදෙ නමින් හැඳින්වෙන පුද්ගලයා විසින් සකස් කරනු ලබන නානුවලින් දේවාභරණ නානුමුර කිරීම සිදු කෙරේ.

සබරගමු නර්තනයේ මාත්‍රා පහේ නැටුම්, පෙරහර නර්තනය සඳහා යොදා ගැනේ. දේවාල පෙරහර සඳහා (බිසෝ පෙරහර, කුමාර පෙරහර, සමන් දේවාල පෙරහර) කාන්තාවන් නර්තනයෙන් සහභාගි වන්නේ නැත. පත්තිනි පෙරහර හා දළදා පෙරහර සඳහා සබරගමු, උඩරට, පහතරට නර්තන, සිංහල, ද්‍රවිඩ ගැමි නැටුම් ආදිය යොදා ගන්නා අතර මෙම නර්තනයන් සඳහා කාන්තා සහභාගිත්වය දැකගත හැකි ය. මහබඹා කෝළම, ආලත්ති තේවය, රතේ නැටුම ආදිය පෙරහරේ නිල පංගුකරුවන් සහභාගි වන අවස්ථාවන් ය.

දිය කැපීමේ පෙරහරින් පසු ගරායකුම ශාන්ති කර්මයෙන් සෙත් පතා අවසන් කෙරෙන මෙම සමන් දේවාල පෙරහර, සබරගමු නර්තනය වඩාත් ඉස්මතු වන අවස්ථාවක් බව කිව හැකි ය.

**කාර්යය පත්‍රිකා අංක - 01**

- පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළ ව කරුණු ඉදිරිපත් කරන්න.
  01. සමන් දේවාලය හා සබැඳි ඓතිහාසික පසුබිම කෙටියෙන් හඳුන්වන්න.
  02. පෙරහර හා සබැඳි චාරිත්‍ර නම් කරන්න.

**කාර්යය පත්‍රිකා අංක - 02**

- පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළ ව කරුණු ඉදිරිපත් කරන්න.
  01. සමන් දේවාල පෙරහරෙහි දැකිය හැකි නර්තන අංග නම් කරන්න.
  02. එම නර්තන අංග සාම්ප්‍රදායික නර්තන, සිංහල ගැමි නර්තන හා ද්‍රවිඩ ගැමි නර්තන ලෙස වර්ග කරන්න.

**කාර්යය පත්‍රිකා අංක - 03**

- පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළ ව කරුණු ඉදිරිපත් කරන්න.
  01. සමන් දේවාල පෙරහරෙහි දැකිය හැකි වාදන අංග නම් කරන්න.
  02. එම වාදන අංග සඳහා යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩ මොනවා ද?

**කාර්යය පත්‍රිකා අංක - 04**

- පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළ ව කරුණු ඉදිරිපත් කරන්න.
  01. නර්තන, වාදන අංගවලින් බැහැර ව සමන් දේවාල පෙරහරෙහි විචිත්‍රත්වය වැඩිදියුණු කිරීම සඳහා යොදා ගනු ලබන විශේෂාංග මොනවා ද?
  02. එම විශේෂාංග නිසා පෙරහර අංලංකාර වූ අයුරු විස්තර කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.2** : වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.2.1** : සෙම්බු, කෝලාට්ටම් නර්තන හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 6.2.2** :

- ''ද්‍රවිඩ ගැමි නැටුම්'' හඳුන්වයි.
- ද්‍රවිඩ ගැමි ජනතාව අතර ප්‍රචලිත ගැමි නැටුම් නම් කරයි.
- ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් නම් කරයි.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් අතර පවතින සමානතා හා අසමානතා විස්තර කරයි.
- ද්‍රවිඩ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- අන්‍ය සංස්කෘතිකාංග අගය කරමින් අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කරගනියි.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 1, කාර්ය පත්‍රිකා, දෘශ්‍ය පට, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වලට අදාළ දෘශ්‍ය පටයක් / අදාළ පින්තූර නිරීක්ෂණයට සලස්වා දක්නට ලැබුණු, රංග වස්ත්‍රාභරණ, භාවිත කරන උපකරණ, යොදා ගන්නා කවි/ගීත, සංගීතය. (වාද්‍ය භාණ්ඩ), නර්තනය සඳහා යොදා ගන්නා චලන හා, නර්තන අංග දැකිය හැකි අවස්ථා පිළිබඳ සිසු අදහස් විමසමින් සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- සිසුන් ගොනු කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට සැලැස්වීම. ඒ පිළිබඳ කරුණු විග්‍රහ කර අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් නම් කරන්න.
- එම ගැමි නැටුම්වලට සමානකම් දක්වන සිංහල ගැමි නැටුම් දෙකක් නම් කරන්න.
- ද්‍රවිඩ ගැමි නැටුම් නැරඹිය හැකි අවස්ථා සඳහන් කරන්න.
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල දැකිය හැකි සමානතා හා අසමානතා ලියන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.3** : වෙනත් සංස්කෘති හා බැඳි නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 6.3.1** : චෙම්බු / කෝලාට්ටම් නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල 6.3.2** :

- චෙම්බු /කෝලාට්ටම් නර්තනය සඳහා සුදුසු ගීත/සංගීත ඛණ්ඩ ශ්‍රවණය කරයි.
- නිමාවක් සහිත නර්තන අංගයක් සඳහා චලන පෙළ ගැස්විය යුතු ආකාරය විස්තර කරයි.
- රංග උපකරණ නිසි පරිදි භාවිත කරයි.
- විධිමත් ව අවකාශය යොදා ගනිමින් සාමූහික නර්තන අංගයක් ඉදිරිපත් කරයි.
- සෙසු කණ්ඩායම්වල නිර්මාණ අගයමින් අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : තෝරා ගත් ගීතයක් /සංගීත ඛණ්ඩයක් සහිත කැසට් පටයක්/C D තැටියක් කැසට් යන්ත්‍රයක්/CD යන්ත්‍රයක්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- චෙම්බු / කෝලාට්ටම් ගැමි නැටුමට අදාළ නර්තනයක කොටසක් ප්‍රදර්ශනය කිරීම.
- සිංහල ගැමි නැටුම්වල නර්තන ශෛලිය හා ද්‍රවිඩ ගැමි නැටුම්වල නර්තන ශෛලිය ප්‍රායෝගික ව ප්‍රදර්ශනය කරමින් එම ශෛලීන් දෙකෙහි වෙනස පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් කර චෙම්බු / කෝලාට්ටම් නර්තන අංගයක් නිර්මාණය කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- කණ්ඩායම් නර්තන ඉදිරිපත් කරවීම හා ඇගයීමට ලක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නිර්මාණය කරන ලද නිමාවක් සහිත චෙම්බු/කෝලාට්ටම් නර්තන අංගයක් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.4** : විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.4.1** : තෛයිපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 6.4.2** :

- තෛයිපොංගල් උත්සවය හා බැඳි ආගමික පසුබිම හඳුන්වයි.
- තෛයිපොංගල් යන වචනයෙහි අර්ථය විග්‍රහ කරයි.
- චාරිත්‍ර විධි නම් කරයි.
- පැවැත්වීමේ හේතු විස්තර කරයි.
- පූජාර්ථය හා විනෝදාස්වාදය මුල් කොටගත් නර්තන අංග භාවිත වන බව ප්‍රකාශ කරයි.
- තෛයිපොංගල් උත්සවය හා බැඳි සැරසිලි පිළිබඳ විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : තෛයිපොංගල් උත්සවය හා සබැඳි ලිපි, පොත්පත්,

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : තෛයිපොංගල් උත්සවය සැමරීමට පෙර සිසුන් දැනුවත් කර ඒ පිළිබඳ තොරතුරු ගොනු කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 1** :

- හුණු පුවරුවෙහි අඳින ලද කෝලම් රටාවක්/කෝලම් රටා කිහිපයක පින්තූර පෙන්වා සිසු දැනුම විමසා පෙර දැනුම් දීම අනුව සිසුන් රැගෙන ආ තෛයිපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

**පියවර 2** :

- සිසුන් ඉදිරිපත් කළ තොරතුරු ද සැලකිල්ලට ගනිමින් තෛයිපොංගල් උත්සවය හා සබැඳි ආගමික පසුබිම, චාරිත්‍ර, සැරසිලි හා නර්තන අංග පිළිබඳ තොරතුරු සාකච්ඡා කර අවශ්‍ය සටහන් ලබාදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- තෛයිපොංගල් උත්සවය පැවැත්වෙන මාසය නම් කරන්න.
- ''තෛයිපොංගල් '' යන වචනය අර්ථ දක්වන්න.
- උත්සවය පැවැත්වීමේ හේතු විස්තර කරන්න.
- තෛයිපොංගල් උත්සවය හා සබැඳි චාරිත්‍ර නම් කරන්න.
- ඔබ කැමති කෝලම් රටාවක් චිත්‍රයට නගන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.4** : විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.4.2** : වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු විස්තර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 6.4.3** :

- වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු රැස් කරයි.
- වෙසක් උත්සවය පැවැත්වීමේ හේතු දක්වයි.
- වෙසක් උත්සවය හා බැඳි නර්තන, ගායන, වාදන හා සැරසිලි පිළිබඳ ව විචාරාත්මක අදහස් දක්වයි
- මෙම උත්සවය හා බැඳි ආගමික වත් පිළිවෙත්වල යෙදීමෙන් මානසික සතුටක් ලැබිය හැකි බව ප්‍රකාශ කරයි.
- උත්සවය සැමරීම සඳහා විවිධ කලාංග නිර්මාණය කරයි.
- මෙම උත්සවය තුළින් ගොඩනැගෙන සමාජ සහජීවනය අගයමින් අදහස් ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වෙසක් උත්සවය හා බැඳි ඡායාරූප, කාඩ්පත්.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : වෙසක් උත්සවය සැමරීමට පෙර සිසුන් දැනුවත් කිරීම හා තොරතුරු රැස්කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 1** :

- පෙර දැනුම් දීම අනුව සිසුන් විසින් රැගෙන ආ තොරතුරු නිරීක්ෂණය කර පහත දක්වා ඇති මාතෘකා අනුව රැගෙන ආ තොරතුරු වර්ග කරගැනීමට උපදෙස් දීම.
- උත්සවය පැවැත්වීමේ හේතු.
    - ආගමික වත් පිළිවෙත් හා ඒවායේ නියැලීමෙන් ලැබෙන ප්‍රයෝජන.
    - නිර්මාණය කරන විවිධ කලාංග.
    - වෙසක් උත්සවය තුළින් ගොඩනැගෙන සමාජ සහජීවනය,

**පියවර 2** :

- කණ්ඩායම්වලට මාතෘකා හා තොරතුරු පත්‍ර ලබා දී එම මාතෘකා පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම. තම කණ්ඩායමට ලැබුණ මාතෘකාවට අදාළ කරුණු ගොනු කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- අදාළ මාතෘකාවට අනුව ගොනු කරගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.
- සෙසු කණ්ඩායම්වල අදහස් විමසමින් සිසුන් ගොනු කරන ලද තොරතුරු තවදුරටත් පෝෂණය කර අවශ්‍ය කරුණු සටහන් කර ගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- වෙසක් උත්සවය නිමිත්තෙන් ඉදිරිපත් කරන නර්තන, ගායන, වාදන අංග හා වෙනත් සාමූහික ක්‍රියාකාරකම් විස්තර කරන්න.
- සමාජ සහජීවනය සඳහා වෙසක් උත්සවය වැදගත් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
- වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි අංගයක් නිර්මාණය කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.4** : විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.4.3** : නත්තල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 6.4.4** :

- නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.
- නත්තල් උත්සවය හා සබැඳි ආගමික වත් පිළිවෙත් අගයමින් අදහස් දක්වයි.
- නත්තල් සමයේ දැකිය හැකි සුවිශේෂ සැරසිලි හා ක්‍රියාකාරකම් විස්තර කරයි.
- නත්තල් උත්සවය හා සබැඳි ගී ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : නත්තල් උත්සවය හා සබැඳි ගීතයක් සහිත CD /කැසට් පට/ C D යන්ත්‍රයක්/ කැසට් යන්ත්‍රයක් නත්තල් කාඩ් පත්, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- නත්තල් උත්සවය හා සබැඳි ගීතයක් ශ්‍රවණයට සැලැස්වීම.
- ගීතයෙහි පද කිහිපයක් සිසුන් සමග ගායනය කිරීම.
- එම ගායනය හා සබැඳි අවස්ථාව පිළිබඳ සිසුන්ගෙන් විමසීම.
- සිසුන් ඉදිරිපත් කරන පිළිතුරු අගයමින් ,උත්සවය පැවැත්වෙන කාලය, පැවැත්වීමේ අරමුණු, ආගමික වත් පිළිවෙත්, උත්සවය හා සබැඳි සැරසිලි හා විශේෂ ක්‍රියාකාරකම්, නත්තල් උත්සවය මගින් සමාජයට දිය හැකි ආදර්ශ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වීම.

**පියවර 2** :

- නත්තල් උත්සවය පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබාදීම. නත්තල් උත්සවය අගයමින් අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : සරල සැරසිලි අංග නිර්මාණය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඇගයිය හැකි ය.

- නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න.
- නත්තල් උත්සවය හා බැඳි චාරිත්‍ර හා සැරසිලි අංග පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
- නත්තල් සමයේ දැකිය හැකි සරල සැරසිලි අංගයක් නිර්මාණය කරන්න. (සුභ පැතුම් පතක් / නත්තල් ගසක්)

# නත්තල් උත්සවය

නත්තල යන වචනයේ අර්ථය උපත යන්න යි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදු වූ දිනය වන දෙසැම්බර් මස 25 වැනි දිනය මුල් කරගෙන මෙම උත්සවය පවත්වනු ලබයි. මෙය **කතෝලික බැතිමතුන්ට** විශේෂ වූ මංගල්‍යයකි.

ක්‍රිස්තුස් වහන්සේ ජේසුතුමා නමින් ද හඳුන්වන අතර එතුමාගේ පියා ජුසේතුමා ය. ජේසුතුමා උපත ලැබුවේ බෙත්ලෙහෙමේ පුංචි ගවමඩුවක දී ය.

ජේසුතුමාගේ අපේක්ෂාව වූයේ පාපයට බර වූ මිනිසුන් ඉන් මුදවා ඔවුනට විමුක්ති මාර්ගය පෙන්වා දීම යි. නත්තල සැමරීම වශයෙන් සැලකෙන්නේ ක්‍රිස්තියානි දහම ඒ ආකාරයෙන් හඳුනාගෙන ඒවා මුළු හදින් ම ක්‍රියාත්මක කිරීම යි.

**නත්තල් උත්සවයෙන් පැහැදිලි වන ගුණධර්ම**

- කළගුණ සැලකීම
- සාමය හා එකමුතුකම

**ආගමික වත් පිළිවෙත්**

- ජේසුතුමන් පැසසීම
- වන්දනාමාන කිරීම
- යාච්ඤා කිරීම
- පාප් වහන්සේ ඇතුළු පූජකවරුන්ගේ දේශනාවලට සවන් දීම

**විශේෂ සැරසිලි සහ කලාංග**

- නත්තල් ගස, නත්තල් සීයා, ගවලෙන්, භක්ති ගීත (කැරොල්), තූර්ය වාදන

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : ගීතයට සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 7.1.1.** : ගීත අසමු ; රස විඳිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල 7.1.2** :
- ගීතයේ ගායනය, පද රචනය හා සංගීත නිර්මාණකරුවන් නම් කරයි.
- ගීතයේ භාෂා විලාසය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- ගීතයේ කලාත්මක පසුබිම පිළිබඳ අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : CD /DVD ශ්‍රව්‍ය පට, කැසට් පට, ගීත ලියන ලද පත්‍රිකා. ඇමුණුම 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :
- ගීතය සවන් දීමට සැලැස්වීම.
- ගීතය ලියන ලද හුණු පුවරුව පෝස්ටරයක්/පත්‍රිකාවක් ප්‍රදර්ශනය කිරීම.
- ගීතයේ පද රචනය ගායන සහ සංගීත නිර්මාණකරුවන් පිළිබඳ සාකච්ඡා කිරීම.
- ගීතයේ අන්තර්ගත සිද්ධීන් සාකච්ඡා කිරීම.
- ගීතයේ භාෂාව, සංගීතය, ගායන ස්වභාවය පිළිබඳ සාකච්ඡා කිරීම.
- ගීතය ගායනයට අවස්ථාව ලබාදීම.
- මෙවැනි ලක්ෂණවලින් යුත් ගීත තෝරා ගැනීම හා සවන් දීමට සිසුන් යොමු කිරීම.
- මෙම ගීතය අනුව නර්තන නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම හඳුන්වා දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- තෝරා ගත් ගීතයෙන් කියැවෙන අදහස කෙටියෙන් දක්වන්න.
- තෝරා ගත් ගීතයේ පදමාලාව හා සංගීත නිර්මාණකරුවන් නම් කරන්න.
- පාන්දරින් ස්කෝලෙට හා මගේ පොඩි යාළු යන ගීත දෙක ගායනය කරන්න.

**පහත වගුව සම්පූර්ණ කරන්න.**

| | **පද රචනය** | **සංගීත නිර්මාණය** | **ගායනය** |
|---|---|---|---|
| පාන්දරින් ස්කෝලෙට | | | |
| මගේ පොඩි යාළු | | | |
| | | | |

- පාන්දරින් ස්කෝලෙට ................................ ගීතය
- මගේ පොඩි යාළු ........................................ ගීතය

| | | |
|---|---|---|
| **නිපුණතාව 7.0** | : | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. |
| **නිපුණතා මට්ටම 7.2** | : | ගීත අනුව නර්තන නිර්මාණය කරයි. |
| **ක්‍රියාකාරකම 7.2.1.** | : | එක් වී ගීතයට නටමු. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 03 යි. |

**ඉගෙනුම් පල 7.2.2** :

- ගීතයට අනුව චලන නිර්මාණ කරයි.
- අදාළ ගීතයට කණ්ඩායම් හා ඒකල වශයෙන් නර්තන නිර්මාණය කරයි.
- අවකාශය භාවිත කරමින් රංග රටා නිර්මාණය කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව ගීතය අනුව නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට,

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- ගීත දෙකෙන් එක් ගීතයක් තෝරා ගන්න.
- තෝරා ගත් ගීතය ගායනය කරවන්න.
- තෝරා ගත් ගීතයට නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ දී අවකාශ භාවිතය, චලන නිර්මාණය, දිශා, තල රටා භාවිතය, සාමුහික ව නර්තනයේ යෙදීම, නිමාවක් සහිත ව නර්තනය නිර්මාණය කිරීම යන කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- තෝරා ගත් ගීතයට අනුව කණ්ඩායම් වශයෙන් නර්තන නිර්මාණයට යොමු කරවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

**පියවර 3** :

- නර්තන නිර්මාණ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හා එම නිර්මාණ පිළිබඳ සාකච්ඡා කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කණ්ඩායම් වශයෙන් තෝරා ගත් ගීතය ගායනය කරන්න.
- නිර්මාණය කරන ලද කණ්ඩායම් නර්තන අංග ඉදිරිපත් කරන්න.
- නිර්මාණය කරන ලද නර්තන අංග පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

ඇමුණුම 1

- පාන්දරින් ස්කෝලෙට..........
- මගේ පොඩි යාළු නෙළුමුද ඕලු.........

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.3** : සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.3.1.** : ගොප් කලා අංගයක් නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04 යි.

**ඉගෙනුම් පල 7.3.2** :

- ගොප් සැරසිලි අංගයක් නිර්මාණයට සුදුසු ද්‍රව්‍ය තෝරයි.
- ගොප් කොළ භාවිත කරමින් සරල කැටයමක් නිර්මාණය කරයි.
- එම කැටයම් භාවිත කරගනිමින් කලාත්මක සැරසිල්ලක් නිර්මාණය කරගත හැකි බවට අදහස් දක්වයි.
- නිර්මාණය කරන ලද එම කැටයම් යොදා ගනිමින් සාමූහික ව ගොප් සැරසිල්ලක් නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද ගොප් සැරසිල්ල පිළිබඳ ව විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගොප් කොළ/ප්‍රදේශය අනුව සපයා ගත හැකි ද්‍රව්‍ය/ පිහියක්/ පේප කටර්/ කෙසෙල් බඩයක්.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ගොප් අත්තෙන් කොළ 04 ක් සිරස් අතට අල්ලා පිහියෙන් කපා ඉවත් කර කොළ සතර වෙනස් නොවන සේ අග කෙළවරින් ගැටයක් ගසා ගැනීමට හුරු කරවන්න.

පියවර 1 :

- ගොප් කොළවලින් සාදන ලද රූං පෙත්තක්/ගොප්කොළ නළාවක්/ මලක් ප්‍රදර්ශනය කර එය නිරීක්ෂණයට සැලැස්වීම.
- ගොප්කොළයක් භාවිතයෙන් දැත් හුරුකර ගැනීම සඳහා කෙටි ක්‍රියාකාරකමක යොමු කරවන්න.
- ගොප් කොළවලින් සකස් කර ඇති වෙනත් සැරසිලි පිළිබඳ විමසමින් උත්සව අවස්ථාවල දී දක්නට ලැබෙන විවිධ ගොප් සැරසිලි, ගොප් සැරසිලි නිර්මාණයේ දී භාවිත කළ හැකි ද්‍රව්‍ය, ගොප් කොළ කැපීමේ හැඩතල, විධික්‍රම, ප්‍රමාණ පිළිබඳ සැලකිලිමත් වීම වැනි කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2 :

- සිසුන්ට පෙනෙන සේ පිහිය අල්ලන ආකාරය ප්‍රදර්ශනය කිරීම.
- නිවැරදි ව පිහිය ඇල්ලීමේ ක්‍රමය සහ ගොප් කොළය කැපීමේ ක්‍රමය පිළිබඳ උපදෙස් ලබා දී අදාළ ද්‍රව්‍ය හා උපකරණ රැගෙන සරළ කැටයමක් කිරීමට යොමු කරවීම.

පියවර 3 :

- සිසුන් කපන ලද ගොප් කැටයම් සියල්ල යොදා ගනිමින් කළ හැකි නිර්මාණ පිළිබඳ විමසා එම ගොප් කැටයම් යොදා ගනිමින් සාමූහික ව සරල සැරසිල්ලක් ගොඩනැගීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 :

- නිර්මාණය කරන ලද සැරසිලි පන්ති කාමරය තුළ දී ප්‍රදර්ශනය කිරීමට සලස්වා ඇගයීමට ලක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- ආගමික උත්සවවල දී දක්නට ලැබෙන ගොප් සැරසිලි දෙකක් නම් කරන්න.
- සාමාජීය උත්සවවල දී දක්නට ලැබෙන ගොප් සැරසිලි පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
- පාසලේ උත්සවයක් සඳහා ඔබ කැමති ගොප් සැරසිල්ලක් නිර්මාණය කරන්න.

## විවිධ සහාය

| | | |
|---|---|---|
| **කංචුක නිර්මාණය** | - | රවීන්ද්‍ර තේනුවර මහතා<br>කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **පරිගණක වදන් සැපයුම** | - | ඒ.ටී.එස්. ගමගේ මහත්මිය<br>ඩී.සී. ජයකොඩි මහත්මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විවිධ සහාය** | - | මාලනී වික්‍රමනායක මහත්මිය<br>කේ.පී. පෙරේරා මහතා<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |